# පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
# කැලණිය විශ්වවිද්‍යාලය


## *වාර්ෂික වාර්තාව - 2022*

# දැක්ම

පාලි හා බෞද්ධ අධ්‍යයනය සඳහා ලෝකයේ විශිෂ්ටතම පශ්චාත් උපාධි පර්යේෂණ මධ්‍යස්ථානය බවට පත්වීම

# මෙහෙවර

පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රයෙහි දැනුම, ආකල්ප හා පර්යේෂණ කුශලතා වර්ධනය කිරීම සඳහා විද්‍යාර්ථීන්ට උපරිම අවස්ථා හා පහසුකම් සැපයීමේ විශිෂ්ටත්වයට ළඟාවීම



# පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

# කැලණිය විශ්වවිද්‍යාලය

## පෙරවදන

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය ථේරවාදය ප්‍රමුඛ පාලි හා බෞද්ධ අධ්‍යයනය සඳහා ම කැප වූ ශ්‍රී ලංකාවේ ඇති එක ම උසස් අධ්‍යාපන ආයතනය වේ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්තා අනුව ශ්‍රී ලංකාවේ වැඩි ම විදේශීය ශිෂ්‍ය ප්‍රමාණයක් ඉගෙනුම ලබන ජාත්‍යන්තර ව පිළිගත් ශාස්ත්‍රීය ආයතනයක් වශයෙන් මෙය නම් කර තිබීම සුවිශේෂ කරුණකි.

එක් දහස් නවසිය හැත්තෑපහ (1975) ආරම්භක වර්ෂයේ පටන් මේ දක්වා වසර හතළිස් හත (47)ක කාලයක් තුළ මෙම ආයතනය ලබා ඇති සංවර්ධනය උදෙසා එය මෙහෙය වූ අධ්‍යක්ෂවරුන්ගේ දූරදර්ශී මාර්ගෝපදේශකත්වය හා කැපවීම අනතිමානීව සඳහන් කරමි.

මෙතෙක් විවිධ ස්ථානයන්හි කුලී පදනම මත පවත්වා ගෙන පැමිණි මෙම ආයතනය, 977/5, University Drive, බුළුගහ හන්දිය, නුවර පාර, කැලණිය ලිපිනයෙහි ස්වකීය වූ අක්කර දෙකක භූමි භාගයේ සිව්මහල් මන්දිරයක 2022 වර්ෂයේ අවසානයේ  සිට පවත්වා ගෙන යෑමට හැකියාව ලැබීම යි. මෙම සත් කාර්යය සඳහා කෝවිඩ් දහනවය වසංගතය හා ආර්ථික අර්බුදය මැද වුවද, අවශ්‍ය ප්‍රතිපාදන ලබා දුන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා විදේශීය ස්වාමීන්වහන්සේලා ප්‍රමුඛ උදව් උපකාර කළ සියලු ම දෙනාට මාගේ කෘතඥතා පූර්වක පුණ්‍යානුමෝදනාව හිමි වේ.

දෙස් විදෙස් විද්‍යාර්ථීන්ගේ පාලි හා බෞද්ධ අධ්‍යයන සඳහා වූ පිපාසය සන්සිඳුවා ලමින්, බෞද්ධ අධ්‍යයනයේ විවිධ මං පෙත් විවර කරමින් නූතන ලෝකයට අවශ්‍ය භාෂා ඥාණයෙන් හා විෂය දැනුමෙන් සන්නද්ධ ගිහි පැවිදි විද්වතුන් බිහි කරන අප ආයතනය ශ්‍රී ලංකා මාතාවගේ සශ්‍රීකත්වය උදෙසා ම කැපවූවකි. එම අරමුණු හොඳින් අවබෝධ කොට ගෙන ඒ සඳහා වෙර වීර්යයෙන් ක්‍රියා කරන ප්‍රාමාණික දැනුමෙන් යුත් ආචාර්ය මණ්ඩලයක් හා කාර්යක්ෂම අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් මෙම ආයතනයේ සිටීම මහඟු ආශීර්වාදයකි.

2023 වර්ෂයේ පටන් බෞද්ධ ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානයක් වශයෙන් තවදුරටත් සංවර්ධනය කර විදේශ විනිමය ඉහළ නැංවීමට දායකත්වය ලබා දීමට ඇප කැප වී කටයුතු කරනු ඇත.

විනේතෘ **ජ්‍යේෂ්ඨ මහාචාර්ය පූජ්‍ය මැදවච්චියේ ධම්මජෝති හිමි**
අධ්‍යක්ෂ
2022.12. 31

පටුන


| | |
|---|---|
| හැඳින්වීම | **1** |
| ඓතිහාසික පසුබිම | **1-2** |
| ශක්තීන් | **2-3** |
| දුර්වලතා | **3** |
| අවස්ථා | **3-4** |
| කළමනාකාර මණ්ඩලය | **5** |
| පීඨසභාව | **6** |
| විගණන කමිටුව | **7** |
| ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන ව්‍යුහය | **8** |
| කාර්ය මණ්ඩල සංයුතිය | **9-10** |
| ශාස්ත්‍රීය ලිපි හා ග්‍රන්ථ ප්‍රකාශන | **11-28** |
| පාඨමාලා පිළිබඳ විස්තර | **29** |
| ශිෂ්‍ය තොරතුරු | **30 -35** |
| **2022** වර්ෂයේදී ප්‍රදානය කරන ලද පර්යේෂණ උපාධි | **36 -37** |
| පුස්තකාලය | **38 - 39** |
| පර්යේෂණ ඒකකය | **40** |
| ආයතනයෙහි මූල්‍ය කටයුතු | **40 - 43** |
| අවසාන ගිණුම් **- 2022** | **44 -108** |
| පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ **2022** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **12** වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව | **109-115** |
| තිරසර සංවර්ධන අභිමතාර්ථ මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව | **116** |

## 01.හැඳින්වීම

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය 1975 වර්ෂයේ ආරම්භ කරන ලදුව, 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලිය අනුව කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව පවත්වා ගෙන යනු ලැබේ. ආයතනයේ ශාස්ත්‍රීය හා පරිපාලන ව්‍යුහය කළමනාකාර මණ්ඩලය විසින් නියාමනය කෙරේ. පශ්චාත් උපාධි පාඨමාලා සංවර්ධනය, අධ්‍යයන පාඨමාලා පවත්වා ගෙන යාම, පර්යේෂණ කටයුතු මෙන් ම පරීක්ෂණ කටයුතු ද ආයතනයේ පීඨසභාව, කළමනාකාර මණ්ඩලය මගින් කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව හා පාලක සභා අනුමැතිය මත සිදු කරනු ලැබේ. අධ්‍යයනාංශ ලෙස බෞද්ධ මූලාශ්‍රය, බෞද්ධ චින්තනය හා බෞද්ධ සංස්කෘතිය යන අධ්‍යයනාංශ ක්‍රියාත්මකය. පරිපාලන ව්‍යුහය මෙන් ම පුස්තකාලය හා පර්යේෂණ ඒකකය ද ආයතනයේ වැදගත් අංශ අතරට එක් වේ.

අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සිංහල හා ඉංග්‍රීසි භාෂාද්වයෙන් පවත්වනු ලැබේ. දේශීය හා විදේශීය විද්‍යාර්ථීන් සඳහා විවෘතව ඇති මෙම ආයතනය දැනට ජාතික මට්ටමින් මෙන් ම ජාත්‍යන්තරව බුදු දහම සන්නිවේදනය කිරීමට මූලිකව ක්‍රියා කරනු ලැබේ. ඒ අනුව පාලි හා බෞද්ධ අධ්‍යයන විෂය ධාරාව යටතේ දෙස් විදෙස් විද්‍යාර්ථීන් දහස් ගණනකට මෙම ආයතනය විසින් පශ්චාත් උපාධි පිරිනමා ඇත. එමඟින් ආයතනය විසින් ශාස්ත්‍රීය ලෝකයට දායාද කළ කීර්තිමත් විද්වතුන් ශාස්ත්‍රීය ලෝකයේ විවිධ ක්ෂේත්‍රවල නියැලෙමින් ජාතික මෙහෙවරක යෙදී සිටීම ආයතනයට මෙන් ම ශ්‍රී ලංකාවට ද අභිමානයකි.

ජාතිකව හා ජාත්‍යන්තරව පිළිගත් කීර්තිමත් විද්වතුන්ගෙන් සැදුම්ලත් අභ්‍යන්තර හා බාහිර ආචාර්ය මණ්ඩලයක් ආයතනික පාඨමාලාවල සම්පත් දායකයන් ලෙස කටයුතු කරති. ආයතනයේ ආදි විද්‍යාර්ථීන් විසින් විදේශ රටවල මෙම ආයතනයට අනුබද්ධ ආයතන මෙහෙයවනු ලැබීම ද ආයතනික ශාස්ත්‍රීය දායකත්වයට කදිම සාධකයකි. දේශීය වශයෙන් ශාස්ත්‍රීය, සමාජීය හා සංස්කෘතික ක්ෂේත්‍රවල ප්‍රගමනයට දායකත්වය සපයමින් ආයතනය සමාජ මෙහෙවරෙහි ද යෙදෙන ආයතනයකි.

විවිධ දිශානති ඔස්සේ බුදු දහමේ හරය විහිදුවාලමින් සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධිය, බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධිය, පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධිය හා බෞද්ධ අධ්‍යයන දර්ශනපති හා දර්ශනසූරී උපාධි වශයෙන් වර්ෂය පුරාම පාඨමාලා පවත්වනු ලැබේ. තරහකාරී ජාතික මෙහෙවරක යෙදෙන මෙම ආයතනය දැනට ශ්‍රී ලංකාවේ වැඩිම විදේශීය විද්‍යාර්ථීන් සංඛ්‍යාවකට ථේරවාදී සම්ප්‍රදායයෙන් පශ්චාත් උපාධි ලබා දෙන ලොව පුමුඛතම ආයතනය බව රේඛීය අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාවල විශ්වවිද්‍යාලවල ශ්‍රේණිගත කිරීම සහ ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාල යටතේ වර්ගීකරණය වීම අභිමානයෙන් සඳහන් කළ යුතුව ඇත.

## 02. ඓතිහාසික පසුබිම

ආයතනය ආරම්භ කරමින් පළමු අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ කීර්තිමත් පැවිදි පඬිරුවනක් වූ ආචාර්ය හැවැන්පොළ රතනසාර නාහිමියන් (1978-1979) විසින් ඇරඹූ ගමන් මඟෙහි බෞද්ධ සමාජයෙහි බුහුමනට පාත්‍ර වූ මහාචාර්ය එල්.පී.එන් පෙරේරා මහතා (1979-1984), මහාචාර්ය ජෝතිය ධීරසේකර මහතා (1984-1990), මහාචාර්ය වයි. කරුණාදාස මහතා (1991-2000), මහාචාර්ය තිලක් කාරියවසම් මහතා (2000-2003), මහාචාර්ය අසංග තිලකරත්න මහතා (2003-2007), මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ මහතා (2007-2013) හා මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල අනු නාහිමි

(2013-2019) යන ගිහි පැවිදි විද්වත්හු ආයතනයේ ගමන් මඟ දීප්තිමත් කරමින් යුග මෙහෙවරක යෙදුනාහ. කොළඹ විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයනාංශයේ හිටපු ප්‍රථම අංශාධිපති හා එහි ම කොන්ෆියුසියස් ආයතනයේ ආරම්භක අධ්‍යක්ෂ විනේතෘ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මැදවච්චියේ ධම්මජෝති ස්වාමීන් වහන්සේ වර්තමානයේ අධ්‍යක්ෂ තනතුර හොබවමින් ආයතනයේ අධ්‍යයන වපසරිය ජාතිකව හා ජාත්‍යන්තරව පුළුල් කිරීමට දිරිමත්ව කටයුතු කරති.

අතීතයේ ඇරැඹි තිරසාර පදනමේ සවිමත් බව මැනවින් ප්‍රකට කරමින් ජාත්‍යන්තර සබඳතා ගොඩනගමින් අනුබද්ධ ආයතන පවත්වා ගනිමින්, ඒවායේ අධ්‍යාපනය නියාමනය කරමින් බුදුදහම එම රටවල විද්‍යාර්ථීන්ට බෙදා දෙනු ලබයි. අධ්‍යයන කටයුතුවල නියැලී සිටින විද්‍යාර්ථීන් හොංකොංහි The Buddha-Dharma Centre of Hong Kong Limited හා චීනයේ The China's Buddhist Academy of Mt.Putuo ආයතනය වෙත පැමිණෙනුයේ බුදු දහමේ අන්තර්ගතය ශාස්ත්‍රීය මෙන් ම සිය ජීවිතයට සමීප කර ගැනීමේ අභිලාෂය පෙරදැරි කර ගෙන බව ඒවායේ ප්‍රතිපෝෂණ වාර්තා මගින් මැනවින් පැහැදිලි වේ. තවදුරටත් මෙම කටයුතුවල ප්‍රගමනය අපේක්ෂිතව ඇමරිකාවේ Zen Institute සහ චීනයේ Ming Zing Culture Center ආයතනය සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සඳහා 2018 වර්ෂයේදී මූලික පදනම ඇති කර ගන්නා ලදුව, 2019 වසර තුළ එහි ඉදිරි පියවර ආරම්භ කර ඇත. එසේම අවබෝධතා ගිවිසුම් අත්සන් කළද 2021 අධ්‍යයන කටයුතු සිදු නොවුණු සිංගප්පුරුවේ The Buddhist Library Graduate School, චීනයේ Kelinyg Academy in Guangxiao Temple, මලයාසියාවේ Malaysian Buddhist Academy හා හොංකොන්හි Glorious Sun ව්‍යාපාරය විසින් පිරිනමනු ලබන ශිෂ්‍යත්ව (MA 15, Mphil හා PhD,6) 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මත කරවීමට අනුමැතිය ලැබීම ජයග්‍රහණයකි.

දැනට සාකච්ඡා මට්මේ පවතින විදේශීය ආයතන වශයෙන් චීනයේ The Academy of Chinese Buddhism, Guandong Buddhist Academy, Buddhist Collage of Jianshu Buddhist University, වියට්නාමයේ Vietnam Buddhist university , ඉන්දුනීසියාවේ University of Borobudur of Indonesia යන විශ්වවිද්‍යාල ආයතන පෙන්වා දිය හැකිය.

Vidyãcarana Buddhist Resource(Malaysia)
Silendra Buddhist Institute, Malaysia
Sitaya International Buddhist Academy (Mynmar)

## 03.ශක්තීන් (Strengths)

1975 ආරම්භයේ සිට පනස් වසරකට (50) ආසන්න කාලයක් මෙම ආයතනයෙන් පශ්චාත් උපාධි ලබා පිටව ගිය දෙස් විදෙස් සිසුන් මෙම ආයතනය පිළිබඳව අභිමානයෙන් කතාකිරීම වැදගත් වේ.

පසුගිය වසර පහක කාලය තුළ දී පාඨමාලා සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය කිරීමෙන් බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ කටයුතු උසස් තත්ත්වයකට පත් කිරීමට මෙම ආයතනය සමත් වී ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් ආයතන අතුරින් වැඩිම විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන එමෙන් ම වැඩිම විදේශ විනිමය ඉපැයීමේ උසස් අධ්‍යාපන ආයතනය මෙය බව රේඛීය අමාත්‍යාංශයේ 2015, 2018 වාර්ෂික වාර්තාවල සඳහන් වේ.

2018 වසර ආයතනයේ ඓතිහාසික වසර ලෙස සටහන් වෙමින් ස්ථීර භූමිභාගයෙහි ගොඩනැගිලි සංකීර්ණයක් නිවහන කර ගැන්මේ කටයුතුවල ආරම්භය සිදු විය. 2019 මැයි මස 14 දින සිට ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන ලදී. 2022 වර්ෂයේ නොවැම්බර් මස සිට සියසේවා කටයුතු කැලණිය,

නුවර පාර, බුලුගහ හන්දිය, යුනිවසිටි ඩ්‍රයිව්, 977/5 හි නව ගොඩනැගිල්ලෙහි ආරම්භ කරමින් ඓතිහාසික ජයග්‍රහණය සනිටුහන් කරන ලදි.

## 04. දුර්වලතා (Weaknesses)

- නේවාසිකාගාර ඇතුළු නවීන ඉඩපහසුකම්වලින් සේවා සැපයීමට නොහැකි වීම
- online අධ්‍යාපනය වඩා ඵලදායීව සිදු කිරීමට තාක්ෂණික බලගැන්වීම් යෝජනා මට්ටමේ පැවැත්ම
- ශීඝ්‍රයෙන් වර්ධනය වන ශිෂ්‍ය ප්‍රජාවට සරිලන පරිදි අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම

ආයතනයේ අනාගත සංවර්ධනය කෙරෙහි මෙම ගැටලු ඉතා අයහපත් ලෙස බලපාන බව සඳහන් කළ යුතුය. ශ්‍රී ලංකාවේ වැඩිම විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉගෙනුම ලබන මෙම ආයතනයෙහි අවම පහසුකම් පවා නොමැතිවීම හේතුවෙන් විදේශීය ශිෂ්‍යයන් සැලකිය යුතු ප්‍රමාණයක් අහිමි වීම ද සැලකිය යුත්තකි.

## 05. අවස්ථා (Opportunities)

i. සුදුසුකම් සම්පූර්ණ කළ ක්‍රියාශීලී ආචාර්ය මණ්ඩලයකින් සමන්විත වීම.

ii. ප්‍රමාණවත් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයන්ගෙන් සමන්විත පුස්තකාලයක් තිබීම.

iii. දැනට ශ්‍රීලංකාවේ වැඩිම ශිෂ්‍ය පිරිසක් හිමි පශ්චාත් උපාධි ආයතනය බවට පත්ව තිබීම.

iv. 2022 වර්ෂයේ මැද භාගයේ ආයතනයට ලබා ගන්නා ලද ඉඩමෙහි සිව්මහල් ගොඩනැගිල්ලේ පදිංචියට යෑම.

v. විදේශීය සිසුන් සඳහා දැනට නම් කර තිබෙන භූමි භාගය ලබා ගැනීමට කටයුතු කිරීම

vi. ජාත්‍යන්තර ආයතන සමග නව සබඳතා ඇති කර ගැනීමට තව දුරටත් කටයුතු කිරීම.

vii. නූතන ලෝකයට ගැළපෙන පරිදි රැකියා අවස්ථා ඉලක්ක කර ගනිමින් නව පාඨමාලා හඳුන්වා දීම.

viii. මාර්ගගත තාක්ෂණයට ගැලපෙන පරිදි සුහුරු පංති කාමර (Smart Class Room) සංකල්පය මත පන්ති කාමර තාක්ෂණිකව බල ගැන්වීම හා ආයතනික වෙබ් අඩවිය සංවර්ධනය කිරීම.

ix. නූතන සමාජ අවශ්‍යතා සැලකිල්ලට ගෙන ආයතනික පර්යේෂණ ප්‍රමාණය ඉහළ නැංවීම හා පර්යේෂණ සඳහා පහසුකම් සලසා දීම.

x. පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයෙහි ජාත්‍යන්තරව පිළිගත් විදේශීය විශ්වවිද්‍යාල හා සම්බන්ධ වී සාකච්ඡා සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීමට අවස්ථා සෙයා බැලීම.

xi. දෙස් විදෙස් විද්‍යාර්ථීන්ගේ දේශන කෞශල්‍ය ප්‍රායෝගිකව වර්ධනය කිරීම සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය (Audio – video) මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම.

## 05.I වෘත්තීය අවස්ථා

i. චීනය, ජපානය , වියට්නාමය, සිංගප්පූරුව හා එක්සත් රාජධානිය වැනි රටවල බොහෝ උසස් අධ්‍යාපන ආයතනවල මෙම ආයතනයේ පාඨමාලා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සේවය කරන විශාල පිරිසක් සිටින බව සඳහන් කළ හැකිය. මේ අයුරින් සලකා බලන විට මෙම අධ්‍යයන ආයතනයේ පාඨමාලා සම්පූර්ණ කරන සියලු දෙනාට ම රැකියා අවස්ථා රාශියක් දේශීයව හා විදේශීයව පැවතීම ද විශේෂත්වයකි.

ii. දෙස් විදෙස් විද්‍යාර්ථීන් බොහෝ දෙනෙකු විසින් තම රැකියාවල උසස්වීම් සඳහා මෙන්ම ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා මෙම ආයතනයේ පශ්චාත් උපාධි හදාරනු ලැබේ.

iii. මෙම ආයතනයෙහි පාඨමාලා මගින් දෙස් විදෙස් විද්‍යාර්ථීන්ට අවශ්‍ය විෂය ඥානය හා භාෂා ඥානය (සිංහල, ඉංග්‍රීසි, පාලි, සංස්කෘත, චීන) ලබා දෙනු ඇත. එසේම නූතන ලොවට නැතුවම බැරි තාක්ෂණ ඥානය ද වර්ධනය කෙරේ. එසේම ප්‍රකාශනය හා රචනය ආදි කුසලතා ද සංවර්ධනය කරනු ඇත. ඒ අනුව ඔවුන් දේශකයන් රචකයන් වනු ඇත.

iv. එසේම මෙම පාඨමාලා මගින් සිසුන්ට ආධ්‍යාත්මික ශික්ෂණය ලබා දෙනු ඇත. ඒ තුළින් ඔවුන් ආර්ථික, දේශපාලන, සමාජ හා පාරිසරික යනාදී ක්ෂේත්‍රයන්හි සදාචාර නියමුවන් වශයෙන් කටයුතු කරනු ඇත.

v. දෙස් විදෙස්හි පවතින බෞද්ධ හා වෙනත් උසස් අධ්‍යාපන ආයතනයන්හි උපකුලපති, අධ්‍යක්ෂ, ආචාර්ය, මහාචාර්ය ආදී තනතුරු දැරීමට එම විද්‍යාර්ථීන්ට හැකියාව ලැබේ.

vi. තිරසාර සංවර්ධනය හා මානවහිතවාදී පරිසර සංරක්ෂණයට ඇපකැපවී ක්‍රියාකළ හැකි විද්‍යාර්ථීන් ද මෙම ආයතනය විසින් නිර්මාණය කරනු ලැබේ.

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය,
977/5 යුනිවසිටි ඩ්‍රයිව්,
බුලුගහ හන්දිය,
නුවර පාර, කැලණිය.
2022.12.31



## 06. කළමනාකාර මණ්ඩලය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 140 වන වගන්තිය යටතේ සාදනු ලැබූ 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 10 වන වගන්තිය යටතේ කළමනාකාර මණ්ඩලය මෙම ආයතනයේ විධායක මණ්ඩලය වේ. එහි සාමාජික මණ්ඩලය මෙසේය.

**<u>නිල බලයෙන්</u>**

1. විනේතෘ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය මැදවච්චියේ ධම්මජෝති හිමි - අධ්‍යක්ෂ (සභාපති)

2. නිමාලි ද සිල්වා මහත්මිය - උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා

3. තරණි අනෝජා ගමගේ මහත්මිය - සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා

**<u>ආයතනයේ අධ්‍යයනාංශ ප්‍රධානීන්</u>**

4. මහාචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය

5. ආචාර්ය පූජ්‍ය වඩිනාගල පඤ්ඤාලෝක හිමි - බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය

6. මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඤාණ හිමි - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය

**<u>කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් පත් කරනු ලැබූ සාමාජිකයන්</u>**

7. එල්.ඊ. සුසන්ත සිල්වා මහතා

8. එස්.කේ. සිරිල් සුදුවැල්ල මහතා

**<u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබූ සාමාජිකයන්</u>**

9. මහාචාර්ය ප්‍රණීත් අහසුන්දර මහතා

10. සම්මානිත මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මිය

11. i) සම්මානිත මහාචාර්ය ඔලිවර් අබේනායක මහතා - 2022.01.01 දින සිට 2022.07.01 දින දක්වා

ii) ආචාර්ය පූජ්‍ය විලේගොඩ අරියදේව හිමි - 2022.07.26 දින සිට

12. මයිකල්ද සිල්වා මහතා

**<u>භාණ්ඩාගාර නියෝජිත</u>**

13. i) **එන්.කේ.එස්. චන්ද්‍රසේකර** මහතා - සහකාර අධ්‍යක්ෂ/ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
(2022.01.01 දින සිට 2022.07.01 දින දක්වා)

**ii)** ආර්.කොළඹගේ මහත්මිය - ප්‍රධාන මූල්‍ය නිළධාරි, මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

**<u>කාර්යාලයීය උපස්ථිතියෙන්</u>**

14. එල්.ඒ.සුමිත් ජයසේකර මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
15. කේ.ඩී.ඩී.එස්. සුගතපාල මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
16. එම්.බී.වයි.ජී. පෙරේරා මහත්මිය - සහකාර ලේඛකාධිකාරී

## 07. පීඨසභාව

1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 13 වන වගන්තිය අනුව ආයතනයට පීඨසභාවක් තිබිය යුතු අතර එය ආයතනයේ අධ්‍යයන බල මණ්ඩලය වන්නේය. එහි සාමාජික මණ්ඩලය මෙසේය.

<u>නිල බලයෙන්</u>

1. විනේතෘ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය මැදවච්චියේ ධම්මජෝති හිමි - අධ්‍යක්ෂ

<u>ආයතනයේ අධ්‍යයනාංශ ප්‍රධානීන්</u>

2. මහාචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා - බෞද්ධ මූලාශ්‍රයඅධ්‍යයනාංශය

3. ආචාර්ය පූජ්‍ය වඩිනාගල පඤ්ඤාලෝක හිමි - බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය

4. මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඤාණ හිමි - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය

**කැලණිය විශ්වවිද්‍යාලයේ පහත සඳහන් අධ්‍යයනාංශ ප්‍රධානීන්**

5. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය මකුරුප්පේ ධම්මානන්ද හිමි (කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය)
6. මහාචාර්ය කේ.බී. ජයවර්ධන මහතා (කැලණිය විශ්වවිද්‍යාලයේ සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය)

**ආයතනයේ එක් එක් අධ්‍යයනාංශයේ ආචාර්යවරු**

7. ආචාර්ය අශෝක වැලිතොට මහතා - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය (2021.05.07)
8. මහාචාර්ය පූජ්‍ය රළුවේ පද්මසිරි හිමි - බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය
9. මහාචාර්ය පී.ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය
10. ආචාර්ය අයි.එන්.එම්. ආරියරත්න මහත්මිය - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය
11. ආචාර්ය ආර්.එම්. රත්නසිරි මහතා - බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබූ සාමාජිකයන්**

12.පූජ්‍ය ආචාර්ය මඩිහේ සුගතසිරි හිමි
13. ආචාර්ය විජිත කුමාර මහතා
14. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආනන්ද තිස්ස කුමාර මහතා (2021.11.17 දින සිට)
15. මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර මහතා
16. මහාචාර්ය ඒ.එම්.එන්. වසන්ත මෙන්ඩිස් මහතා

**කාර්යාලයීය උපස්ථිතියෙන්**

17. එල්.ඒ. සුමිත් ජයසේකර මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
18. එම්.බී.වයි.ජී. පෙරේරා මහත්මිය - සහකාර ලේඛකාධිකාරී

<u>ආරාධිත</u>

19. එම්.කේ. ගීතානී අත්තනායක මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී

## 08. විගණන කමිටුව

ආයතනයේ විගණන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

**කමිටු සාමාජික භවතුන්**

1. එස්.කේ. සිරිල් සුදුවැල්ල මහතා - (සභාපති)

2. **i)** එන්.කේ.එස්. චන්ද්‍රසේකර මහතා - සහකාර අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

   **ii)** ආර්.කොළඹගේ මහත්මිය - ප්‍රධාන මූල්‍ය නිළධාරි, මුදල් ආර්ථික ස්ථායිකරණසහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

3. නිමාලි ද සිල්වා මහත්මිය - උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා

4. එම්.එම්.ජේ.ආර්. බෝගමුව මහතා - ප්‍රධාන අභ්‍යන්තර විගණක විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව

**ආරාධිත නිරීක්ෂක**

5. පී.එම්.ආර් පතිරාජ මහතා - සහකාර විගණකාධිපති, රජයේ විගණ අංශය

6. එස්.එම්.එස්. සමරවීර මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක (2022.01.01 දින සිට 2022.02.28 දින තෙක්)
   - නියෝජ්‍ය අභ්‍යන්තර විගණක, කැලණිය විශ්වවිද්‍යාලය (2022.09.12 දින සිට)

**කාර්යාලයීය උපස්ථිතියෙන්**

7. එල්.ඒ. සුමිත් ජයසේකර මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - ලේකම්

8. කේ.ඩී.ඩී.එස්. සුගතපාල මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

9. එම්.කේ. ගීතානී අත්තනායක මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී

10. එම්.බී.වයි.ජී. පෙරේරා මහත්මිය - සහකාර ලේඛකාධිකාරී

**පවත්වන ලද විගණන කමිටු රැස්වීම් ගණන - 04**

## 09. ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන ව්‍යුහය


| | |
|---|---|
| 01. අධ්‍යක්ෂ | විනේතෘ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය මැදවච්චියේ ධම්මජෝති හිමි<br>BA (SJP), MA (PGIPBS), MPhil (PGIPBS), PhD (Nanjing-china), Fulbright Fellow UCIA (USA), Commonwealth Fellow, University of Wales, UK |
| 02. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | එල්.ඒ. සුමිත් ජයසේකර මහතා<br>MHRM (UoC)<br>PGD - LRHRM (UoC)<br>B.A.(SJP)<br>Dip. in Advanced English (UoC) |
| 03. ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | කේ.ඩී.ඩී.එස්. සුගතපාල මහත්මිය<br>B.B.A.(Accounting)-Special (UoC) |
| 04. ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | එම්.කේ. ගීතානි අත්තනායක මහත්මිය<br>BA. (Special), M.A.(Kelaniya)<br>MLSc. (Colombo) |
| 05. සහකාර ලේඛකාධිකාරී | එම්.බී.වයි.ජී. පෙරේරා මහත්මිය<br>B.Sc.Business Admn (Sp) (Admin)<br>M.A. (Econ)(Kelaniya) |

<u>අධ්‍යයනාංශ හා ප්‍රධානවරුන්</u>

| | |
|---|---|
| 06. බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය | **i.** මහාචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා<br>PhD (SJP) PhD (ප්‍රාචීන භාෂෝපකාර සමාගම, 2013)<br>MA (SJP) ,MA (Kelaniya) ,MA (BAP) , BA (Hons)<br>BA ( ප්‍රාචීන භාෂෝපකාර සමාගම, 1999)<br>(2021.05.07 දින සිට) |
| | **ii.** ආචාර්ය ඩබ්ලිව්.ඒ. වැලිතොට මහතා<br>PhD (University of Hong Kong)<br>M.B.S. (University of Hong Kong)<br>**(**2021.01.01 දින සිට 2021.05.06 තෙක්) |
| 07. බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය | පූජ්‍ය ආචාර්ය වඩිනාගල පඤ්ඤාලෝක හිමි<br>BA (Special – Peradeniya), M.A.(Taiwan), MPhil (Peradeniya), PhD (Ncu – Taiwan) |
| 08.බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය | මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඤාණ හිමි<br>MPhil. (Peradeniya), BA (Peradeniya) |

**10. කාර්යය මණ්ඩල සංයුතිය 2022.12.31 දිනට**

**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ සංවිධාන සටහන**



| සේවක වර්ගීකරණය | | | | |
|---|---|---|---|---|
| සේවය | වැටුප් කේතය | අනුමත කරන ලද කාර්යමණ්ඩලය | සත්‍ය කාර්ය මණ්ඩලය 2022/12/31 දිනට | පුරප්පාඩු 2022/12/31 දිනට |
| ප්‍රාථමික මට්ටම | | | | |
| ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු | PL - 1 | 6 | 4 | 2 |
| ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු | PL - 1 | 4 | 4 | - |
| | | | | |
| ද්විතියික මට්ටම | | | | |
| කලමනාකරණ සහකාර - තාක්ෂණික නොවන | U - MN 1 | 15 | 13 | 2 |
| | | | | |
| තෘතියික මට්ටම | | | | |
| විධායක - කනිෂ්ඨ මට්ටම | U - EX 1 | 1 | 1 | - |
| විද්‍යාත්මක සහකාර | U- AS 1 | 2 | 2 | - |
| | | | | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | | | | |
| විධායක - මධ්‍යම මට්ටම | U - EX 2 | 2 | 2 | - |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | U - AC 3 | 5 | 5 | - |
| මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U – AC 5 | 5 | 5 | - |
| **මුළු එකතුව** | | **40** | **36** | **4** |

## 11. ශාස්ත්‍රීය ලිපි, ග්‍රන්ථ ප්‍රකාශන හා ශාස්ත්‍රීය දායකත්වය

### (1) මහාචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා - අධ්‍යයනාංශ ප්‍රධාන - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය (2021.05.07 දින සිට)

**පර්යේෂණ හා ප්‍රකාශන**

1 ශ්‍රී ලාංකික ආරාමික සංවිධානයේ මෑත යුගයේ ඇතිවූ විනය විවාද පිළිබඳ අධ්‍යයනයක්, ධම්මගතාසති, මකුලෑවේ ශ්‍රී විමල මහා ස්වාමීන්ද්‍ර අභිවන්දනා ශාස්ත්‍රීය සංග්‍රහය, මහාවිහාර වංශික ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ප්‍රකාශනය, 2022

2 සංස්කාරක සටහන, දීඝනිකාය මහාවග්ග සූත්‍ර විමර්ශනය, නුවණ ප්‍රකාශනය, 2022

3 දීඝනිකායේ මහාවග්ගයේ භාෂා භාවිතය, දීඝනිකාය සූත්‍ර විමර්ශනය, නුවණ ප්‍රකාශනය, 2022

4 මහා පරිනිබ්බාන සූත්‍ර විවරණය, දීඝනිකාය සූත්‍ර විමර්ශනය, නුවණ ප්‍රකාශනය, 2022

**ග්‍රන්ථ සංස්කරණය**

1 දීඝනිකාය සූත්‍ර විමර්ශනය (මහාවග්ග) නුවණ පර්යේෂණායතනයේ ප්‍රකාශනය, 2022

2 පෙළ අටුවා තුලනය, නුවණ පර්යේෂණායතනයේ ප්‍රකාශනය 2022

**ව්‍යාපෘති**

දුර්ලභ පුස්කොළ පොත් සංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සීහළවත්ථුප්පකරණය සංස්කරණය, සිංහලයට පරිවර්තනය කිරීමට අදාළ පර්යේෂණයේ නියැලීම.

**විවිධ ක්ෂේත්‍රවල දායකත්වය**

- මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ අ.පො.ස. (උසස් පෙළ), පාලි විෂය ප්‍රායෝගික සම්මන්ත්‍රණවල සම්පත් දායකයෙකු ලෙස ක්‍රියා කිරීම.
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රාචීන ප්‍රාරම්භ, ප්‍රාචීන මධ්‍යම, ප්‍රාචීන අවසාන විභාග සඳහා ද දහම් පාසල් අවසාන, බෞද්ධ ධර්මාචාර්ය, මූලික පිරිවෙන් අවසාන, බෞද්ධ ධර්මාචාර්ය, මූලික පිරිවෙන් අවසාන හා අ.පො.ස. උසස් පෙළ යන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම, ප්‍රමිත කිරීම හා පිළිතුරු පත්‍ර ඇගයීම යන ක්‍රියාවලියට සම්බන්ධ සම්පත් දායකයෙකු ලෙස ක්‍රියා කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ඒකකය යටතේ මූලික පිරිවෙන් විෂය මාලාවේ ත්‍රිපිටක ධර්මය පෙළ පොත සකස් කිරීම හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සකස් කිරීමට සම්පත් දායකයෙකු ලෙස ක්‍රියා කිරීම.

- බුද්ධශාසන අමාත්‍යාංශය යටතේ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට අදාළ දහම්පාසල් පෙළ පොත් සකස් කිරීමේ කමිටුවේ සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ත්‍රිපිටක සංරක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
- ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ යාවජීව සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
- ලෝක බෞද්ධ සම්මේලනයේ යාවජීව සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට දායකත්වය**

MABS 09: බෞද්ධ විනය හා ආරාමික සංවිධානය

MABS 35: ථේරවාද සම්ප්‍රදාය: ඉතිහාසය හා ධර්ම කරුණු පිළිබඳ අධ්‍යයනයක්

MABE 72: Introduction to Pali

MAPL 01: නිර්දිෂ්ට ග්‍රන්ථ: ත්‍රිපිටක පාලි සාහිත්‍යය

MAPL 05: පාලි ඡන්දෝලංකාර

MABC 02: බෞද්ධ පෞරුෂත්ව විශ්ලේෂණය

PDBC 01: මනෝකායික ගැටලු පිළිබඳ අධ්‍යයනය

CPBS 03: Readings in Pali Texts II

CPBS 01:මූලික පාලි ව්‍යාකරණය

PDPL 01:නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය

## (2 ) <u>ආචාර්ය අශෝක වැලිතොට මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය</u>

**01.** ආයතනික කටයුතු:

**පීඨසභාවට සහභාගීවීම**
**අධ්‍යයන කමිටුවට සහභාගීවීම**
**පුස්තකාල කමිටුවට සහභාගීවීම**
ආයතනික තාක්ෂණික කමිටුවලට සහභාගීවීම
Course Co-ordinator: Master of Arts in Pali (English medium)

Course Co-ordinator: Postgraduate Diploma in Pali (English medium)
Course Co-ordinator: Certificate Course in Pali for Postgraduate Buddhist Studies
Course Co-ordinator: Buddha-dharma Centre of Hong Kong
Co-editor, *Anveṣaṇā*, *Journal of the Postgraduate Institute of Pali and Buddhist Studies*, Postgraduate Institute of Pali and Buddhist Studies, Sri Lanka (in progress)

**02.** ඉගැන්වීම් හා අගැයීම් කටයුතු:
පහත සඳහන් විෂය ඒකකයන්ට අදාළ ඉගැන්වීම් හා ඇගයීම් කටයුතු කිරීම
MABS 35: Theravada Tradition: A Historical and Doctrinal Study
MAPL08: Theravada Tradition: A Historical and Doctrinal Study
MABS 06: Origins of Mahayana Buddhism and the Earliest Mahayana Sutras
MABS 73: පාලි භාෂාව: හැඳින්වීමක්
MABC 01: බෞද්ධ මනෝවිශ්ලේෂණය
MABC 01: Psycho-analysis of Buddhism
PGDP 01: Prescribed Texts I
PGDP 06: ආදි බුදුසමයේ මූලික ඉගැන්වීම්
PDBC 07: බෞද්ධ භාවනා මූලධර්ම - 1
CPBS 01: Basic Pali Grammar
CPBS 02: පාලි ග්‍රන්ථ අධ්‍යයනය
CPBS 03: පාලි ග්‍රන්ථ අධ්‍යයනය - ii

**03 සම්පත් දායකත්වය:**
පර්යේෂණ වැඩමුළු - දෑ අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව
පර්යේෂණ වැඩමුළු - දර්ශනපති සහ දර්ශන විශාරද ශාස්ත්‍රපති උපාධි පාඨමාලා

**04 අධීක්ෂණ කටයුතු:**
දර්ශනපති සහ දර්ශන විශාරද ශිෂ්‍ය සම්මන්ත්‍රණවලට සහභාගිවීම
දර්ශනපති හා දර්ශන විශාරද සිසුන් අධීක්ෂණය කිරීම
දර්ශනපති හා දර්ශන විශාරද සිසුන් සඳහා පවත්වනු ලබන සම්න්ත්‍රණවලට සහභාගිවීම

**05 පර්යේෂණ:**
**1.සද්ධර්ම අන්තර්ධානය : පාලි අට්ඨකථා ඇසුරින් කෙරෙන අධ්‍යයනයක්**

**06. වෙනත් විශ්වවිද්‍යාල සඳහා වූ ශාස්ත්‍රීය දායකත්වය:**
Visiting Lecturer (Online)
Malaysian Buddhist Association
Course unit taught: MABS 05: Buddhalogical Development: A Study based on pre-Mahayana Buddhist Literature

## (3) ආචාර්ය පූජ්‍ය වඩිනාගල පඤ්ඤාලෝක හිමි - අධ්‍යයනාංශ ප්‍රධාන - බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය

### I. Publications

#### Peer Reviewed Journals

'Sacrifice' in Buddhist ethics and Consequentialism, in *Journal of Royal Asiatic Society* of Sri Lanka (JRASSL), Colombo, 2022, 64 Volume 64, Issue II

**Book Chapters**
**2022**
**'Skanda-gupta** (455-467 CE) **and Indian Religious Tolerance'** submitted to the Bharatiya Adhyanana Kendra, Benares Hindu University, India

**Forthcoming**

**2022 (E-book)**
*Deviant Sex and Buddhism*, D.K. Printworld, Delhi, *Emerging Perceptions of Buddhist Studies* No 24, ISBN-13: 9788124611227, Publishing Date 07 November 2022.

## II. Research

Completed the research under the title "Buddhist Kamma Theory: A Framework for Female Empowerment'

**Oxford Bibliography 2022**
**'Buddhist Education in Taiwan'** in *Vibhajana,* Ed. H.S. Samarasinha and A.M.A. Dilani Aththanayaka**,** published by the Nagananda International Buddhist University, Kelaniya, **2018** pp.432-444 is Included in the Oxford Bibliography on Taiwan Buddhism edited by Professor Wei-yi Chen.

**Editorial Work**

Co-Editor of the *Anvesana* Peer Reviewed Journal,2021,
Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya,
Sri Lanka, Volume 11 Issue II (English)
Co-Editor: Dr. Asoka Welitota **(forthcoming)**

## III. Conference/Webinar Papers

I. Presented the paper on "Practicing **Loving-Kindnes (*mettā*): A Path for Peace**" at the 09th International Conference on Pali and Buddhism on the theme: Samatha and Vipassana: Practice and Application" organized by Mahabodhi Society of India in Collaboration with Anagarika Dharmapala International Institute for Pali and Buddhist Studies, India
**Date: 06 November 2022**

II. Presented the topic on **"Interdependence: Buddhist principal of practicing Forgiveness'** at the Virtual Conference organized by Clairmont Theological Collge in Collaboration with Jain Society
**Date: 04 November 2022**

III. **The Abstract on the Value of Human Life was published in the Conference Proceedings** edited by Nandini Batista, India (March-2022), Interdisciplinary Institute Indian Institute of Human Security & Governance, India
Theme: Human Security and Good Governance
Topic**: Understanding Value of Human Security: A Buddhist Reading**
(Special Address) Website Reference: https://iihsg.com/Blog.aspx

Three-day IIHSG International Conference 2022 on Human Security & Governance during February 23-25

IV. A presentation was done on Concept of tolerance at the Pakistan Hotel, Pakistan

V. Presentation was conducted online for the conference organized by the Claremont Theological School, United States of America, Coordinator Professor Venu Mehta
Topic: "Cognition and Non-violence (ahimsa): An Early Buddhist Analysis"
Date: on February 18-19, 2022

**V. Television Presentation**

A dhamma talk was telecast on 18th May 2022 in the Jatika Rupavahini

**VI. Guest Lectures**

I. "Forgiveness in Daily Life: A Buddhist Analysis "delivered for Khyunhla Buddhist University, Myanmar (online).
Date: 12th November 2022

II. "Thai Upasampada in Sri Lanka: An Appraisal" was delivered at the Symposium on "Buddhist Diplomacy: Sri Lanka Thailand Relations organized by the Royal Thai embassy in Colombo: Coordinated by Dr, George H.I, Cooke, Awarelogue International, at Buddhist Cultural Centre, Thummulla, Colombo
07th June 2022.

**VII. Resource Person**

**I.Topic: 'Plagiarism'** delivered at the Research Methodology Workshop for MPhil and PhD Candidates organized by the Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya
Date: 09th December 2022.

**II.Topic**: "Development of Buddhism in Sri Lanka from the Introduction to 13th Century," delivered for Refresh Course on Buddhism, organized by Department of Philosophy, Jadavpur University, Kolkata with University Grants Commission, India
Date: 14th November 2022 (Online)

**III.Topic** "Literature Review and Formulating a Research Problem" delivered for the Workshop on research methodology conducted for Master of Arts Degree Students at the PGIPBS
Date: 26/06/2022

**VIII.Administration**

Head of Department, Department of Buddhist Thought, Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya (from 2019 Up to date)

Academic Co-ordinator of the Master of Arts Degree in Buddhist Studies (One Year -English Medium)- (2019 upto date)
Chairman, Academic Committee

## IX. Supervisions

Mphil/PhD Supervisions

One Year Master of Arts Degree Programme, extended essay supervisions

Two Year Master of Arts Degree Programme- Dissertation Supervisions

## X. Thesis Examiner

1. Name of the Candidate: REV. SHI DAOXIN (Registration Number: PGIHS/PhD/17/18/017),
Doctor of Philosophy. Thesis title: *Venerable Fa Fang, A Modern Buddhist Visionary- A Critical Study of His Thoughts and Their Influence on Buddhism in Modern Era*

## XI. Coordinating: International Programmes 2022

**Coordinator, Series of Guest Lectures organized by the Department fo Buddhist Thought PGIPBS (four lectures were completed)**

**Coordinator 'Buddhist-Jewish Dialogue', Series of presentations, with Professor Nathan Katz and PGIPBS (two sessions were completed)**

## XII. Teaching Subjects
**Postgraduate Teachings**

Early Buddhist Thought, Chinese Buddhist Tripitaka, Buddhist Ethics, Research Methodology, Personality Analysis of Buddhism, Philosophical Trends in Buddhism, Pali Language

## XIII. Other Activities
Provided funding through the Yuan Kuan Buddhist College in Taiwan for publishing the Biography of Most Venerable Amabagahawatte Indasabhavara Gnanasami, the founder of Sri Lanka Ramanna Sect

## XIV. Social Welfare
**2022**
**On 12th June 2022- Donatiion of Dru food and money for five hundered familes at the Siri Sunadna Mahaviharaya, Beliatta, Sri Lanka**
**Sponsor: PJ Kwan Inn Teng Temple, Malaysia**

On 05th June 2022, dry food and money were donated to 500 families at the Jetawanarama

Temple in Colombo-14, Sri Lanka

Sponsor: Madam Huang Ye-hua and Taiwan Group

On the 19th March 2022, A dana ceremony was conducted with the participation of 75 Myanmar Buddhist monks and nuns with 40 Sri Lankan Budhdist monks at Yahanagala Anceitn Royal Temple, Bandagirya, Hambantota

## (4) මහාචාර්ය පූජ්‍ය රළුවේ පද්මසිරි හිමි - බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය

### 01. Academic ContributionBooks

Co-editor with Ven. Aparekke Sirisudhamma, *Ambagahawatte Indasabhawara Gnanaswami Mahanayaka Swamindra Caritaya* by Ven. Kotmale Sirisaddhammawamsa, Wadinagala PannalokaThera published: Smart Print Solution, 2022.
Co-editor with Asanga Tilakaratne, *Dhammagatasati- Makulewe Sri Wimala MahanayakaFelicitation Volume,* Borella: State Press, 2022.
Co-editor with S. Ganganath and others, *Rahulaprabha- Birthday Celebratory Felicitation Volume*,Colombo 14: Jetavanarama Maha Viharaya, 2022.

### 02. Supervision of MPhil/PhD

#### I. Completed

Ven. Varanyana, (Reg: 2015/Ph.D./E/3747) A Critical Study of Concept of Motivation in JātakaStories.

#### II. Ongoing

16 MPhil Thesis
13 PhD Thesis

### 03. Administrative Contribution to Other Universities

i. Member of Faculty Board of Buddhist Studies, Nagananada International BuddhistUniversity
ii. Member, Institutional Research Committee

### 04. Reviewer of Journal Articles, Abstracts and Syllabi

i. Journal of Buddhist Culture, Dept. of Buddhist Culture, Buddhist & Pali University
ii. Journal of Humanities, University of Ruhuna
iii. Journal of Buddhist Studies, SIBA, Volume VII - II, 2022
iv. Abstract Reviewer, International Online Conference, 7th International Buddhist Conference(2nd Online Conference), Buddhist education: Past Present & Future, on 16th November 2022
v. An Evaluator, MA in Buddhist Studies Postgraduate Degree Programms, Department of Pali& Buddhist Studies, University of Sri Jayawardhenepura, 2022.
vi. A Reviewer, BA in Buddhism and Jurisprudence, Faculty of Buddhist Studies,

NaganandaInternational Buddhist University]

**05. Contribution to PGIPBS**

i. Coordinator to the programme of Postgraduate Diploma in Buddhist Studies (English medium)
ii. Member of Academic Committee
iii. Member of Faculty Board
iv. Member of examination panel of MPhil & PhD
v. Website Master, PGIPBS
vi. President, Prospectus Editorial Committee, (English medium)
vii. Member, Prospectus Editorial Committee, (Sinhala medium)
viii. Member, MPhil/PhD Research Presentations
ix. Member, Minor Procurement Committee, PGIPBS

**06. Associations & Societies**

i. Co-Secretary of Sri Lanka Association of Buddhist Studies.
ii. Coordinator, Online Reading Session of "How Theravada Is Theravada… ed. Skilling,Peter, Once fortnight, From August 2021 - March 2022.
iii. Online Sutta discussion dialogue, Once in Every week for commoners.

**07. Teaching (Taught Courses)**

**A. Internal (PGIPBS)**

i. MABS 27- Social Dimension of Buddhism (English & Sinhala media)
ii. PDBS 03- Buddhist Social Philosophy (English medium)
iii. PDBC 06- Sources Studies of Buddhist Cancelling (Sinhala Medium)
iv. MABC 06- Sources for Buddhist Cancelling (English & SInhala media)

**B. External (Other Universities)**

i. Visiting Lecturer, Master of Arts in Sociology, University of Kelaniya, 2022.
ii. Visiting Lecturer, Master of Arts in Buddhist Studies Programme, University ofColombo, 2022.

**08. Conferences and Vebina**

Session Chair of the "Buddhist Education for Layman", 7th International Buddhist Conference (2nd Online Conference), Buddhist education: Past Present & Future, on 16thNovember 2022.

**09.** Institutional Development

Chairman of the Following Working Committees in relation to the New Building Premises of the Institute.

a. A Committee of Constructing Buddha Image House
b. A Committee of Enhancing Landscape

**(5)** **ආචාර්ය ආර්.එම්. රත්නසිරි මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) - බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය**

## Annual Report of Work - 2022 for Ministry of Higher Education

**Dr. R. M. Rathnasiri**
**Senior Lecturer (Gr. II), Department of Buddhist Thought**
**Postgraduate Institute of Pali and Buddhist Studies (PGIPBS), University of Kelaniya**

1. Lectures (30 hours) – MABS 40–Buddhist Philosophy of Education and Communication, Postgraduate Institute of Pali and Buddhist Studies –PGIPBS.
2. Lectures (50 hours) Level I & II– English for Buddhist Studies (EBS) for MA, MPhil & PhD candidates –PGIPBS.
3. Lectures (15 hours) – MABS 71 – Ethical Philosophy, PGIPBS.
4. Lectures (15 hours) – MABC 02 Buddhist Personality Analysis –PGIPBS.
5. Workshop (10 hours) – MABC 02 Buddhist Personality Analysis –PGIPBS.
6. Coordinating Workshop on MABS 72 –Research Methodology and Extended Essay –PGIPBS.
7. Conducting lectures at Workshop on MABS 72 –Research Methodology and Extended Essay – PGIPBS.
8. Coordinating Workshop on MPhil & PhD –Research Methodology–PGIPBS.
9. Conducting lectures at Workshop on MPhil & PhD –Research Methodology–PGIPBS.
10. Coordinating EBS –English for Buddhist Studies –PGIPBS
11. Marking – MA Research Proposals –PGIPBS
12. Marking – MA Extended Essays –PGIPBS
13. Supervising – more than 10 MPhil Research –PGIPBS.
14. Supervising – 04 PhD Research –PGIPBS.
15. Supervising & editing MA, MPhil & PhD Abstracts and Proposals
16. Evaluation as examiner two PhD dissertations – PGIPBS
17. Evaluation as examiner one MA -2yr thesis – Buddhist and Pali University of Sri Lanka
18. Lecture Series – Fundamental Teaching of Buddhism – Diploma in English, Buddhist and Pali University of Sri Lanka.
19. Lecture Series – Buddhist Principles and Contemporary Social Issues – Higher Diploma in English, Buddhist and Pali University of Sri Lanka.

20. Supervising – 02 PhD Research, Nāgānanda International Institute for Buddhist Studies (NIIBS), Manelwatta, Bollegala, Kelaniya.
21. Participating as an Examiner at MPhil and PhD presentation sessions –PGIPBS.
22. Coordinating – (PGIPBS affiliation) the Buddhist Library Graduate School – Buddhist Research Society, Singapore.
23. Coordinating – (PGIPBS affiliation) (MyBA) Malaysian Buddhist Academy, Malaysia.
24. Lectures (30 hours) (MyBA) Malaysian Buddhist Academy – MA MABS 72 –Research Methodology and Extended Essay.
25. Participating as Member – Faculty of Humanities and Social Sciences, Nāgānanda International Institute for Buddhist Studies (NIIBS), Manelwatta, Bollegala, Kelaniya
26. Participating as Member of the Academic Committee and Faculty Board –PGIPBS.
27. Participating as Member of the Exam Board –PGIPBS.
28. Participating as a Member of the Viva Board – PGIPBS.
29. Paper setting & Assignments
    (i) MABS 40, (ii) MABS 71, (iii) MABC 02 and (iv) EBS – PGIPBS.
30. Marking MABS 40 / MABS 71/ MABC 02 / PDBS 01 Answer Scripts – PGIPBS
31. Marking MABS 40 / PDBS 01 Assignments – PGIPBS.
32. Second marking MABS & MABC 2022– PGIPBS.
33. Paper Moderation – MABS & MABC 2022 PGIPBS.
34. An Editor – '***Anveṣaṇā***', the peer-reviewed Journal of PGIPBS.
35. Editing Prospectus 2023-2024 (English medium) – new edition as secretary to the Prospectus Editorial Committee – PGIPBS
36. Coordinating – Two-year MA in Buddhist Studies – English Medium – PGIPBS
37. Translation into English – Buddhist Civilization–G.C.E. A/Level Examination 2022, Department of Examination, Sri Lanka.
38. Translation into English – Buddhism–G.C.E. A/Examination (New & Old) 2022, Department of Examination, Sri Lanka.
39. Performing as Chief Examiner, Moderator and Control Marker to Open Competitive Exams at Department of Examination, Sri Lanka 2022.
40. Participation in institutional meetings convened on miscellaneous matters at PGIPBS throughout the year 2022.

41. A research article for ICBS Academic Journal with Sri Lanka Foundation in USA ("*Surmounting of Fear and Other Impediments to Mind Development*").
42. A research article for Vietnam Journal For Indian And Asian Studies ("*An Irrefutable Semblances of Buddhist Heritage in Sri Lanka and Vietnam through Fundamental Tenets & Religious-cultural Relations*")
43. A research article for Journal Buddhist and Pali University of Sri Lanka ("*Inspirations from Environment for a Flourishing Meditative Life: A Buddhist Perspective*")
44. A research article for Buddha Sanghamitra, Theravada Buddhist Magazine edited by Samana Ariya Braham, India ("*Surmounting the Impact of Five Hindrances on Mind Development*")
45. A research article for a Journal – Bhiksu University of Sri Lanka ("*Pre-awareness of Right View (Sammā Diṭṭhi) as a Pre-requisite for Mind Development*")
46. A research article for Felicitation Journal in memory of late Ven. Murungasyaye Gnanissara Nayaka Thera in France ("*Role of Morality in the Buddhist Path of Liberation as Exposed in the Discourses*")
47. A research article for AMITABHA 1st International Conference (AIC 2022) in Chattogram, Bangladesh ("*Enhancement of Mental Peace for Refurbishment of World Peace*")
48. A research article for the International Seminar on Buddhism and its Contemporary relevance on the 27th and 28th of July 2022 at the Pachaiyappas College Campus, Chennai ("*Relevance of Ethics in Buddhism to Conciliatory Existence in the Contemporary World*")
49. Dhamma Discussion at Dhammasarana Buddhist Temple, Keys borough, Victoria 317, Australia from 7.30 – 9.30 am on 5th November, 2022
50. Presentation Online at the Launching Ceremony of the Special Issue On "Sri Lanka-Vietnam Buddhist and Historical Relations"- 29th December, 2022.
51. Guest Speaker at the International Seminar on Buddhism and its Contemporary relevance held on the 27th and 28th of July 2022 at the Pachaiyappas College Campus, Chennai.
52. Reviewed – two abstracts for IRCHSS 2023 Abstracts for the 8th International Research Conference on Humanities and Social Sciences Faculty of Humanities and Social Sciences, University of Sri Jayewardenepura
53. Reviewed – two research articles (January & April) for SOSHUM Jurnal Sosial dan Humaniora, [Journal of Social Sciences and Humanities], POLITEKNIK NEGERI BALI : Jl. Kampus Bukit Jimbaran, Kuta Selatan, Badung, Bali-Indonesia
54. Speaker - A series of Dhamma lectures and a meditation programme at the religious event and cultural program organized by the Sri Lanka Embassy in Riyadh from 12th to 16th May, 2022.

**(6) මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඤාණ හිමි - අධ්‍යයනාංශ ප්‍රධාන - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය**

**Academic**

Research Paper Presentation

- "The Middle Way: Buddhist Approach towards Interreligious Dialogue" Presented to the 5th International Conference on World Religions held on October 29-30 at Minhaj University Lahore.

Research Articles published

- "Aesthetics of the Canon: A Study of Canonical Narratives" *Rethinking Buddhism, Text, Context, Condensation* (ed. Anand Singh), Primus Books, Delhi, 2022.

- "An Inquiry into the Parable of the Converted Husband: A Buddhist Perspective: An Inquiry into the Commentarial Parable of the Converted Husband", *Christian Witness in a Multi-Religious World* (ed. Indunil Kodithuwakku K.). Libreria Vatikana, Vatican, 2022.

    - නිකායභේදය ඇතිවීම සම්බන්ධයෙන් රාජගුරු මොරතොට ශ්‍රී ධම්මක්ඛන්ධ මහනාහිමියන්ගේ වගකීම (The Responsibility of Rājaguru Moratota Srī Dhammakkhandha Maha Nāyaka Thera), ධම්මගතාසති (මකුලෑවේ ශ්‍රී විමල මහාස්වාමීන්ද්‍ර අභිවන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්. රළුවේ පද්මසිරි හිමි, අසංග තිලකරත්න), ශ්‍රී ලංකා රාමඤ්ඤ මහ නිකාය, 2022.New Courses Introduced

    - Short Course of Sri Lankan Heritage and Field Research

    Dissemination of Knowledge: Seminars, Talks and Workshops

- Main Lecture of the Launch of five Research Journals by the Department of Humanities of the Rajarata University of Sri Lanka held on the January 02, 2023.

- Dhamma Talk on 'Truthfulness' at YMBA, Borella, Sri Lanka on October 16, 2023

- Dhamma Talk on 'Renunciation' at YMBA, Borella, Sri Lanka on June 19, 2022

- Guest Lecture on "Some Statement of the Buddha in the Light of Abhidhamma" for the Departmental Webinar Series of the Postgraduate Institute of Pali and Buddhist Studies on February 15, 2022.

- A lecture in Pali on "Āṅgala-Pālana-samaye Laṅkāyaṃ Vibudhā Bhikkhū: Tiṇṇam Bhikkhūnam Carita-kathā Saṅkhepato (Erudite Monks in Sri Lanka under the British Rule: Biographies of Three Monks in Brief)" for the 6th Anniversary of the Shan State Buddhist University on February 07, 2022.

- Talks for the International Dhamma Talk Series organized by International Buddhist Confederation on January 07, 2022

- Resource Person to give a Talk on Conceit in Right Way and Wrong Way: Looking Through Abhidhamma for the (Virtual) Seminar conducted by International Buddhist Confederation in New Delhi on January o6, 2022

**Academic and other positions**

- Research Evaluation Committee Member to evaluate Internal Academic and Administrative Staff of the Postgraduate Institute of Pali and Buddhist Studies (2020, 2021)

- Coordinator for the Master of Arts in Buddhist Āyurvedic Counseling (English Medium) for 2021

- Member of Senate of Sri Lanka Bhiksu University, Anuradhapura (August 27, 2018-up-to-date)

- Member of the Postgraduate Committee of Sri Lanka Bhiksu University, Anuradhapura (August 27, 2018-up-to-date)

- Member of the Senate of the University of Kelaniya with effect from May 06, 2015, up-to-date

- Member of the Management Board of the Postgraduate Institute of Pali and Buddhist Studies, the University of Kelniya with effect from May 06, 2015

- Head of the Department of Buddhist Culture of the Postgraduate Institute of Pali and Buddhist Studies, the University of Kelaniya with effect from May 07, 2015

## (7) මහාචාර්ය පී.ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය

1. ආයතන කටයුතු :

සනාතන සභාවට සභාභාගි වීම.
කළමණාකාර මණ්ඩලයට සභාභාගි වීම.
පිඨ සභාවට සභාභාගි වීම.
අධ්‍යයන කමිටුවට සභාභාගි වීම.
පුස්තකාල කමිටුවට සභාභාගි වීම.

2. ඉගැන්වීම් හා ඇගයීම් කටයුතු :

MABS 26 - Buddhist Psychotherapy
MABS 26 - බෞද්ධ මනෝචිකිත්සාව
MABC 03 - Buddhist Psychotherapy
MABC 06 - Buddhist Meditation ii (Therapeutic Application)
MABC 02 - මනෝකායික ගැටලූ පිළිබඳ බෞද්ධ උපදේශන ක්‍රම
MABC 03 - බෞද්ධ මනෝචිකිත්සාව
MABC 08 - බෞද්ධ භාවනාව (චිකිත්සාමය භාවිතය)
| 12020 | ඊ. ඩබ්ලිව්. ගුණතිලක ඉතුරුම්:<br>086-2-001-6-1189664 | 78,809.73 | - |
| 12021 | අධ්‍යක්ෂක අරමුදල - ස්ථාවර තැන්පතු:<br>086-60-01-00013175-5 | 600,000.00 | - |
| 12022 | අධ්‍යක්ෂක අරමුදල - ඉතිරිකිරීම්: 086-2-002-5-1189664 | 193,142.40 | - |
| 12026 | ඉතිරි කිරීම් - සුබසාධන අරමුදල - චීනය : 086-2-004-3-1189664 | 62,868.50 | - |
| 12027 | ස්ථාවර තැන්පතු- සංවර්ධන අරමුදල :<br>086-60-01-00014223-5 | 4,047,548.23 | - |
| 12028 | ස්ථාවර තැන්පතු - වාහන අරමුදල- II :<br>086-60-01-00014156-6 | 1,229,357.78 | - |
| 12029 | ස්ථාවර තැන්පතු- සංවර්ධන අරමුදල :<br>-086-60-01-00015111-7 | 5,387,500.00 | - |
| 12030 | ස්ථාවර තැන්පතු- සංවර්ධන අරමුදල ii- 086-60-01-00015914-6 | 1,291,943.58 | - |
| 12031 | කෙටි කාලීන ස්ථාවර තැන්පතු ආයෝජන | 48,600,176.57 | - |
| 12032 | ස්ථාවර තැන්පතු බැඳුම්කර උල්ලංඝන ආරියසේන මහතා 086-60-01-00016586-1 | 1,645,426.63 | - |
| 12033 | ස්ථාවර තැන්පතු පරිත්‍යාග 086-60-01-00016586-1 | 10,975,618.03 | - |
| 12034 | ස්ථාවර තැන්පත් සංවර්ධන අරමුදල 086-60-01-00016681-5 | 4,206,684.93 | - |
| 12035 | ස්ථාවර තැන්පතු පරිත්‍යාග/086-60-01-00016788-7 | 6,374,467.81 | - |
| 13001 | ඉන්වෙන්ට්‍රි - භාණ්ඩ | 830,550.15 | - |
| 13002 | ඉන්වෙන්ට්‍රි - ප්‍රකාශන | 773,845.54 | - |
| 13003 | ඉන්වෙන්ට්‍රි - විදුලිපංකා | 592,800.00 | - |

| | | | |
|---|---|---|---|
| 13004 | ණය කරුවන් - කැළණිය විශ්වවිද්‍යාලය | 4,403.98 | - |
| 13006 | සුළු ලැබීම් | 4150.00 | - |
| 13008 | පූර්ව - ගෙවීම් | 256,438.18 | |
| 13012 | ඉන්ධන අත්තිකාරම් | - | - |
| 13013 | ඉන්ධන තැන්පතු | 50,000.00 | - |
| 13014 | විවිධ අත්තිකාරම් | - | - |
| 13015 | දුරකතන තැන්පතු | 5,000.00 | - |
| 13016 | විදුලිය සඳහා නැවත ගෙවනු ලබන තැන්පතුව | 75,000.00 | |
| 13017 | මහායාන ශිෂ්‍යත්ව ප්‍රදාන | - | - |
| 13019 | නිඹිරිගස්යාය ගිණුමෙන් මුදල් මාරු කිරීම් | - | - |
| 13021 | සුළු මුදල් | - | - |
| 13022 | වලංගු කරන ලද කුවිතාන්සි | - | |
| 13023 | ලැබිය යුතු - විවිධ | 144,500.00 | - |
| 13025 | මුදල් වෙළඳ පොළ ඉතුරුම් ගිණුම : 086-2-003-4-1189664 | 11,796,767.66 | - |
| 13026 | සේවක යෙදවුම් අත්තිකාරම් ගිණුම -ගොඩනැගිල්ල සඳහා | - | - |
| 13027 | ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොළිය | 3,851,102.45 | - |
| 13028 | බහාලුම් සඳහා නැවත ගෙවනු ලබන තැන්පතුව / MSC Lanka | 100,000.00 | |
| 13029 | තැන්පතු - ජල සම්පාදන මණ්ඩලය | 443,475.00 | |
| 24002 | ගබඩා භාරකරු - බැඳුම්කර | - | 5,000.00 |
| 24004 | සරප් - බැඳුම්කර | - | 20,000.00 |
| 24005 | ආපන ශාලා තැන්පතු | - | - |
| 24008 | පුස්තකාල තැන්පතු | - | 3,950,310.00 |
| 24010 | ණය හිමියා - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභාව - 0.01% | - | 8,616.79 |

| | | | |
|---|---|---|---|
| 24013 | ටෙන්ඩර් තැන්පතු | - | 244,500.00 |
| 24015 | ගෙවීමට ඇති U.P.F - 20%, 17% | | - |
| 24016 | ගෙවීමට ඇතිE.T.F - 3% | - | - |
| 24017 | ගෙවීමට ඇති විශ්‍රාම වැටුප් 8% | - | - |
| 24018 | ගෙවීමට ඇති U.P.F ණය - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභාව | - | - |
| 24020 | ගෙවීමට ඇති වැටුප් | - | - |
| 24021 | ගෙවීමට ඇති මුද්දර ගාස්තු | - | |
| 24023 | ගෙවීමට ඇතිසුළු මුදල් | - | 5,000.00 |
| 24024 | ණයගැති - සතුට බිල්ඩර්ස් සමාගම - ගොඩනැගිල්ල | - | 87,151,765.99 |
| 24025 | ණය හිමියා - කායීය මණ්ඩල සුබ සාධක අරමුදල - PGIPBS | - | 445,616.86 |
| 24026 | ගොඩනැගිල්ල මත රඳවා තබා ගැනීම් | - | 20,605,174.63 |
| 24030 | උපචිත වියදම් - 2020 | - | 627,900.00 |
| 24031 | උපචිත වියදම් - බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව- 2020 | - | - |
| 24032 | උපචිත වියදම් - බෞද්ධායුර්වේද උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව- 2020 | - | - |
| 24033 | උපචිත වියදම්- EBS - 2020 | - | - |
| 24034 | උපචිත වියදම්- CPBS 2020 | - | - |
| 24037 | උපචිත වියදම් 2021 | - | 1,797,779.43 |
| 24038 | උපාධි ප්‍රධානෝත්සයව සඳහා වෙන්කිරීම් | - | 548,185.00 |
| 24039 | උපචිත වියදම් - බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව / S - 2021 | - | 460,000.00 |
| 24040 | උපචිත වියදම් - බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව/E 2021 | - | 275,600.00 |
| 24041 | උපචිත වියදම් - බෞද්ධායුර්වේද උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව- 2021 | - | 200,200.00 |
| 24042 | උපචිත වියදම්- CPBS 2021 | - | 216,600.00 |

| | | | |
|---|---|---|---|
| 24043 | උපචිත වියදම්- BDCHK 2021 | - | 886,000.00 |
| 24044 | උපචිත වියදම්- PGCC 2021 | - | 1,250.00 |
| 24045 | උපචිත වියදම්- EBS 2021 | - | - |
| 24046 | භාවනා වැඩසටහන - 2022 සඳහා එකතුව | - | 240,000.00 |
| 24047 | ණය හිමියා - Sathuta Builders - වැට සහ ආරක්ෂක කුටිය | - | 1,916,234.99 |
| 24048 | උපචිත වියදම් - සිංගප්පූරුව/2022 | - | 101,832.85 |
| 24049 | උපචිත වියදම් - බෞද්ධායුර්වේද උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව- 2022 | - | 687,105.09 |
| 24050 | උපචිත වියදම් - බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව / S - 2022 | - | 1,323,825.00 |
| 24051 | උපචිත වියදම් - බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව / E- 2022 | - | 1,125,670.09 |
| 24052 | උපචිත වියදම්- CPBS/E 2022 | - | 641,116.74 |
| 24053 | උපචිත වියදම්- CPBS/S 2022 | - | 16,650.00 |
| 24054 | උපචිත වියදම්- EBS/ 2022 | - | 187,000.00 |
| 24055 | උපචිත වියදම්- BDCHK/ 2022 | - | 3,720,417.59 |
| 24112 | ණය හිමියා - 3S Construction | - | - |
| 24113 | උපචිත වියදම්-2022 | - | 5,510,702.10 |
| 25001 | වියදම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන - 101 | - | - |
| 25002 | වියදම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන- 102 | - | - |
| 25003 | වියදම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන- 103 | - | - |
| 25004 | බෞද්ධ ආයුර්වේද උපදෙස් සඳහා වියදම් කරන ලද ප්‍රදාන | - | - |
| 25005 | ව්‍යාපෘති දීර්ඝ කිරීම මගින් වියදම් කරන ලද ප්‍රදාන | - | - |
| 25006 | වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන - 102 | - | - |
| 25007 | බෞද්ධ ආයුර්වේද උපදෙස් සඳහා වියදම් නොකළ ප්‍රදාන | - | - |
| 25008 | ව්‍යාපෘති දීර්ඝ කිරීම මගින් වියදම් නොකළ ප්‍රදාන | - | - |

| | | | |
|---|---|---|---|
| 25009 | වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන- 103 | - | - |
| 25010 | පරිත්‍යාග මගින් වියදම් කල ප්‍රදාන | - | - |
| 25011 | සංවර්ධන අරමුදලින් වියදම් කල ප්‍රාග්ධන වියදම් | - | 500,000.00 |
| 25012 | සමුඝ්චිත අරමුදල් - ප්‍රාග්ධන | | 627,268,083.42 |
| 26002 | වාහන අරමුදල - 1 | - | 26,027.95 |
| 26003 | ස්ථාවර තැන්පතු පොළිය : ගොඩනැගිලි අරමුදල<br>086-60-01-00003281-7 | - | 8,902,704.70 |
| 26004 | ස්ථාවර තැන්පතු පොළිය- වාහන අරමුදල:<br>086-60-01-00013088-1 | - | 529,251.56 |
| 26005 | ගොඩනැගිලි අරමුදල | - | 2,900,000.00 |
| 26006 | විදේශ ශිෂ්‍යත්ව ප්‍රදාන | - | 133,148.82 |
| 26010 | ඉතිරිකිරීම් ගිණුමේ පොළිය- 265060643-9 | - | 673,515.71 |
| 26011 | ඒ.ඩබ්ලිව්. ගුණතිලක අරමුදලෙහි ලැබිය යුතු පොළිය : 086-60-01-00013087-2 | - | 6,065.07 |
| 26012 | ස්ථාවර තැන්පතුවෙහි ලැබිය යුතු පොළිය - සංවර්ධන අරමුදල : 2/0115/02/54207 | - | 16,835.15 |
| 26013 | ස්ථාවර තැන්පතුවෙහි ලැබිය යුතු පොළිය : ගොඩනැගිලි අරමුදල<br>086-60-01-00003281-7 | - | 155,213.65 |
| 26014 | ස්ථාවර තැන්පතුවෙහි ලැබිය යුතු පොළිය - වාහන අරමුදල - : 086-60-01-00013088-1 | - | 5,248.53 |
| 26016 | ගිවිසුම් කඩකිරීම් - බී.ජී. විශ්වනාත් මහතා | - | 127,102.24 |
| 26017 | ආයතනයේ සංවර්ධන අරමුදල | - | 45,072,499.16 |
| 26018 | බැඳුම්කර ආදායම් අරමුදල උල්ලංඝනය කිරීම - ආරියසේන මහතා | - | 453,812.12 |
| 26019 | ස්ථාවර තැන්පතුවෙහි පොළිය: ආයතනයේ සංවර්ධන අරමුදල086-60-01-000010304 | - | 5,860,943.69 |
| 26020 | ස්ථාවර තැන්පතුවෙහි පොළිය: විදේශීය ශිෂ්‍යත්ව 078-60-01-00008630-4 | - | 297,822.21 |
| 26023 | ගබඩා භාරකරු තැන්පතු පොළිය : 10061-04-91551 | - | 5,664.06 |

| | | | |
|---|---|---|---|
| 26024 | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය: සංවර්ධන අරමුදල 086-60-01-000010304 | - | 266,143.23 |
| 26025 | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය: සංවර්ධන අරමුදල: 2/0115/02/54185 | - | 16,835.15 |
| 26026 | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය: සංවර්ධන අරමුදල: 2/0115/02/54193 | - | 16,835.15 |
| 26029 | අධ්‍යක්ෂකවරයාගේ අරමුදල් | - | 2,649,642.25 |
| 26030 | පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | - | 18,916,050.00 |
| 26031 | සමුඡ්චිත අරමුදල - පුනරාවර්තන | - | 32,348,885.37 |
| 26032 | පයේෂණ ප්‍රදාන - ඊ.ඩබ්ලිව්. ගුණතිලක | - | 15,000.00 |
| 26033 | වාහන යලි තක්සේරුව | - | 1,846,371.64 |
| 26034 | මහායාන ශිෂ්‍යත්ව ගෙවීම් | | - |
| 26035 | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය: සංවර්ධන අරමුදල : 086-60-01-00014223-5 | - | 19,627.84 |
| 26036 | ස්ථාවර තැන්පතු පොළිය - වාහන අරමුදල II :<br><br>086-60-01-00014156-6 | - | 165,122.75 |
| 26037 | වාහන අරමුදල- II | - | 1,064,235.03 |
| 26038 | ඉතුරුම් පොළිය - ඊ.ඩබ්ලිව්. ගුණතිලක: 086-2-001-6-1189664 | - | 2,364.52 |
| 26039 | කායීය මණ්ඩල සුබසාධන අරමුදල - චීනය | - | 671,623.53 |
| 26040 | ස්ථාවර තැන්පතු පොළිය: සංවර්ධන අරමුදල: 2/0115/0254185 | - | 913,793.39 |
| 26041 | ස්ථාවර තැන්පතු පොළිය: සංවර්ධන අරමුදල:2/0115/02/54193 | - | 913,793.39 |
| 26042 | ස්ථාවර තැන්පතු පොළිය: සංවර්ධන අරමුදල:2/0115/02/54207 | - | 913,793.39 |
| 26043 | ඉතුරුම් පොළිය : අධ්‍යක්ෂකවරයාගේ අරමුදල<br><br>086-2-002-5-1189664 | - | 141,893.35 |
| 26044 | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය: අධ්‍යක්ෂකවරයාගේ අරමුදල 086-60-01-00013175-5 | - | 17,260.27 |
| 26045 | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය: බැඳුම්කර උල්ලංඝන086-60-01-00003282-6 | - | - |
| 26047 | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය: වාහන අරමුදල- II: | - | 23,239.91 |
| 26048 | පොළිය සුබ සාධන අරමුදල- චීනය: ඉතුරුම්/ස්ථාවර තැන්පතු | - | 41,244.97 |

| | | | |
|---|---|---|---|
| 26049 | ස්ථාවර තැන්පතු/ඉතුරුම් පොළිය ඊ.ඩබ්ලිව් ගුණතිලක : 086-60-01-00013087-2 | - | 411,445.21 |
| 26050 | ස්වයං මූල්‍ය ව්‍යාපෘති මගින් ශිෂ්‍යත්ව ප්‍රදාන | - | 1,284,729.57 |
| 26051 | ග්ලෝරියස් සන් ශිෂ්‍යත්ව ප්‍රධාන | | 1,793,200.05 |
| 26052 | ස්ථාවර තැන්පතු පොළිය : බැඳුම්කර උල්ලංඝන 086-060-01-00012962-4 | - | 27,940.11 |
| 26053 | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය: සුබසාධන අරමුදල - චීනය | - | 27,602.74 |
| 26054 | ස්ථාවර තැන්පතු පොළිය : බැඳුම්කර උල්ලංඝන ආරියසේන මහතා | - | 1,191,614.51 |
| 26055 | සුහුරු පන්නි කාමරය සඳහා පරිත්‍යාග | - | - |
| 26056 | ස්ථාවර තැන්පතු පොළිය සංවර්ධන අරමුදල 086-60-01-00014223-5 | - | 547,548.23 |
| 26058 | ස්ථාවර තැන්පතු ලැබියයුතු පොළිය සංවර්ධන අරමුදල 086-60-01-00015111-7 | - | 6,420.72 |
| 26059 | බැඳුම්කර උල්ලංඝන අරමුදල - ආරියසිංහ මහතා | - | - |
| 26060 | නව ගොඩනැගිල්ල සඳහා පරිත්‍යාග | - | - |
| 26061 | බුදු කුටිය සඳහා පරිත්‍යාග | - | - |
| 26063 | ස්ථාවර තැන්පතුව සඳාහා ලැබිය යුතු පොලී අදායම 086-01-00016498-8 | - | 152,483.71 |
| 26066 | ස්ථාවර තැන්පතුව සඳාහා ලැබිය යුතු පොලී අදායම 086-01-00015914-6 | - | 33,979.88 |
| 26067 | ස්ථාවර තැන්පතුව මත පොලිය 086-01-00015914-6 | - | 91,943.58 |
| 26068 | ස්ථාවර තැන්පතුව මත ලැබිය යුතු පොලී අදායම 078-600100008630-4 | - | 15,709.81 |
| 26069 | ස්ථාවර තැන්පතුව මත ලැබිය යුතු පොලී අදායම 086-60-01-100012962-4 | - | 10,039.52 |
| 26070 | ස්ථාවර තැන්පතුව මත පොලිය 086-60-01-00015111-7 | - | 387,500.00 |
| 26071 | ලැබිය යුතු පොලිය - සරප්- 086-60-01-00015915-5 | - | 3,112.88 |
| 26072 | ස්ථාවර තැන්පතුව මත පොලිය 086-60-01-00016586-I | - | 717,915.32 |
| 26073 | ලැබිය යුතු පොලිය - සරප්- 086-60-01-00016586-1 | - | 36,084.22 |
| 26074 | ස්ථාවර තැන්පතුව මත පොලිය 086-60-01-00016788-7 | - | 452,394.17 |
| 26075 | ස්ථාවර තැන්පතුව මත ලැබිය යුතු පොලී අදායම 086-60-01-00016788-7 | - | 162,417.95 |

| | | | |
|---|---|---|---|
| 26076 | ස්ථාවර තැන්පතුව මත පොලිය 086-60-01-00016681-5 | - | 206,684.93 |
| 26077 | ස්ථාවර තැන්පතුව මත ලැබිය යුතු පොලී අදායම 086-60-01-00016681-5 | - | 129,658.10 |
| 31011 | රජයේ ප්‍රදාන පුනරාවර්තන | - | 74,033,000.00 |
| 31012 | ණය මගින් ලද පොළිය | - | 103,943.21 |
| 31013 | ලියාපදිංචි ගාස්තු | - | 451,500.00 |
| 31014 | පන්නි ගාස්තු | - | 62,166,257.90 |
| 31015 | විභාග ගාස්තු | - | 342,718.91 |
| 31016 | පුස්තකාල ගාස්තු | - | 304,000.00 |
| 31017 | ප්‍රකාශන අලෙවිය | - | 1,668.78 |
| 31018 | පුස්තකාල දඩ | - | 16,643.00 |
| 31020 | විවිධ ලැබීම් | - | 58,500.00 |
| 31021 | සහනික පත්‍ර ගාස්තු | - | 119,260.00 |
| 31022 | ඡායා පිටපත් ගාස්තු | - | 12,589.00 |
| 31023 | අයදුම්පත් ගාස්තු | - | 412,000.00 |
| 31025 | පරණ පුවත්පත් විකිණීම | - | 7,565.00 |
| 31026 | ටෙන්ඩර් ගාස්තු | - | 41,500.00 |
| 31027 | වීසා ආදායම | - | 26,568.63 |
| 31028 | මුද්‍රණ ගාස්තු | - | 790.00 |
| 31029 | භාහිර ශිෂ්‍ය ගාස්තු | - | 350.00 |
| 31030 | අදායම ආයෝජන මගින් ලදපොළිය | - | 8,346,868.10 |
| 31032 | srap අලෙවි ගිණුම | - | 176,500.00 |
| 31033 | ස්වයං මූල්‍ය පාඨමාලා මගින් ලද ආදායම | - | 51,400,424.49 |
| 31036 | විශ්‍රාම ගැන්වීම මත සත්‍ය අදායම/පාඩුව | - | 2,265,474.00 |

| | | | |
|---|---|---|---|
| 310211 | විදුලි පංකා අලෙවිය (vijinipath) | - | 227,800.00 |
| 310212 | Repo/මුදල් වෙළඳපොල | - | 6,182,446.29 |
| 310213 | දීර්ඝ කරන ලද ව්‍යාපෘති මගින් ලද වෙනත් අදායම් - 7% | - | 7,633,142.78 |
| 500001 | MABC/S - 2021 | - | - |
| 500002 | MABC/E - 2021 | - | - |
| 500003 | PDBC - 2021 | - | - |
| 500004 | EBS - 2021 | - | - |
| 500005 | CPBS - 2021 | - | - |
| 500006 | MA IN BS (BDCHK) - 2021 | - | - |
| 500010 | බෞද්ධ ආයුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව - 2020 | - | - |
| 500011 | බෞද්ධ ආයුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව- 2020 | - | - |
| 500013 | පාලි සහතික පත්‍ර පාඨමාලාව - 2020 | - | - |
| 500016 | PGCC - 2021 | - | - |
| 500020 | MABC/S - 2022 | - | - |
| 500021 | MABC/E-2022 | - | - |
| 500022 | BAC Dip-2022 | - | - |
| 500023 | CPBS - E- 2022 | - | - |
| 500024 | BDCHK - 2022 | - | - |
| 500025 | EBS - 2022 | - | - |
| 500026 | BLGS-SINGAPORE 2022 | - | - |
| 500027 | CPBS/S - 2022 | - | - |
| 1300901 | මුදල් ගිණුම - බොරැල්ල | 21,583,219.68 | - |
| 1300902 | මුදල් ගිණුම - තිඹිරිගස්‍යාය | 31,613,354.69 | - |

| | | | |
|---|---|---|---|
| 1300903 | ඉතිරි කිරීමේ ගිණුම චීන බැංකුව - රූ | 6,499,787.80 | - |
| 1300904 | USD BFCA-PB නිඹිරිගසය්‍යාය | 30,020,697.03 | - |
| 11009-1 | Ven. M.W. මහාවිහාරය | - | |
| 11009-3 | ඉරෝම් මෙනවිය -ශ්‍රී දළදා මාලිගාව | - | |
| 11009-4 | මහාචාර්‍ය දේශප්‍රිය - සීහලවත්තුපකරණය | - | |
| 11901-2 | පුස්තකාල පොත් වාර සඟරා ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන | - | 12,892,542.89 |
| 11902-2 | ගෘහ භාණ්ඩ සහඋපකරණක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන | - | 4,313,536.95 |
| 11904-2 | මෝටර් රථ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන | - | 9,148,000.00 |
| 11905-2 | කාර්‍යාලීය උපකරණ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන | - | 23,035,432.80 |
| 11906-2 | විද්‍යාගාර ඉගෙනුම් උපකරණ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන | - | 2,814,993.27 |
| 11907-2 | අස්පර්ශනීය වත්කම් ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන | - | 425,000.00 |
| 13007-1 | පරිගණක ණය | 3,000.00 | - |
| 13007-2 | ආපදා ණය | 2,268,166.00 | - |
| 13007-5 | වාහන ණය | - | - |
| 13007-7 | විශේෂ අත්තිකාරම් | - | - |
| 24011-1 | ගෙවීමට ඇති උපයනවිට ගෙවීම් බදු | 12,593.81 | - |
| 24012-13 | පූර්ව ලැබීම් | - | 230,500.00 |
| 26015-2 | වෙනත් ග්‍රන්ත පරිත්‍යාග | - | |
| 11011 | පුද්ගල පඩිනඩි - අධ්‍යන කාර්‍යීය මණ්ඩලය | 13,713,077.25 | - |
| 11021 | U.P.F - 15%, 7% - අධ්‍යන කාර්‍යීය මණ්ඩලය | 2,751,608.42 | - |
| 11031 | U.P.F - 8% - අධ්‍යන කාර්‍යීය මණ්ඩලය | 2,702,047.12 | - |
| 11041 | E.T.F - 3% - අධ්‍යන කාර්‍යීය මණ්ඩලය | 1,090,731.13 | - |
| 11051 | අධ්‍යන දීමනාව | 21,708,626.11 | - |

| | | | |
|---|---|---|---|
| 11061 | පයේෂණ දීමනා 35% - අධ්‍යන කාර්ය මණ්ඩලය | 4,799,577.05 | - |
| 11071 | සමාන කිරීමේ දීමනාව - අධ්‍යනකාර්ය මණ්ඩලය | - | - |
| 11091 | විශේෂ දීමනාව -20% - අධ්‍යන | 2,742,615.44 | - |
| 11101 | ජීවන වියදම් දීමනාව - අධ්‍යනකාර්ය මණ්ඩලය | 936,000.00 | - |
| 11111 | වැඩබැලීමේ දීමනාව - අධ්‍යනකාර්ය මණ්ඩලය | - | - |
| 11121 | බාහිර කතිකාචාර්ය ගාස්තු ගමන් ගාස්තු ඇතුළුව | 1,590,950.00 | - |
| 11131 | ප්‍රධානී දීමනාව - අධ්‍යන | 36,000.00 | - |
| 11141 | ගැලපුම් දීමනාව | - | - |
| 11171 | වෙනත් දීමනා - අධ්‍යනකාර්ය මණ්ඩලය | - | - |
| 11181 | විනෝදාස්වාද දීමනාව - අධ්‍යන කාර්ය මණ්ඩලය | 607,265.90 | - |
| 11191 | කාර්ය මණ්ඩල විශේෂ මාසික දීමනාව - Rs. 5000/- | 600,000.00 | - |
| 11201 | විශ්‍රාමික ප්‍රතිලාභ - අධ්‍යන කාර්ය මණ්ඩලය | - | - |
| 11204 | විශ්‍රාමික ප්‍රතිලාභ -අධ්‍යන පූර්ව සේවා | - | - |
| 11205 | විශ්‍රාමික ප්‍රතිලාභ -අධ්‍යන වත්මන් සේවා | 1,081,119.00 | - |
| 11206 | විශ්‍රාමික ප්‍රතිලාභ -අධ්‍යන පොළිය | 1,218,560.00 | - |
| 12012 | වැටුප් හා වේතන අනධ්‍යන | 14,041,630.63 | - |
| 12022 | U.P.F - 15%, 7% - අනධ්‍යන | 1,747,580.63 | - |
| 12032 | U.P.F - 8% - අනධ්‍යන කාර්ය මණ්ඩලය | 1,370,396.07 | - |
| 12042 | E.T.F - 3% - අනධ්‍යන කාර්ය මණ්ඩලය | 623,595.50 | - |
| 12062 | පයේෂණ දීමනා - 35% - අනධ්‍යන | 629,745.04 | - |
| 12072 | මාසික වන්දි දීමනා -45% | 5,685,030.88 | - |
| 12092 | විශේෂ දීමනා -20% - අනධ්‍යන | 2,526,680.42 | - |
| 12102 | ජීවන වියදම් දීමනාව - අනධ්‍යන | 2,468,070.96 | - |

| | | | |
|---|---|---|---|
| 12112 | වැඩ බැලීම සඳහා ගෙවීම් - අනධ්‍යන කාර්‍ය මණ්ඩලය | 4,200.00 | - |
| 12132 | නිවාඩු ගෙවීම් | 93,658.41 | - |
| 12142 | ගැලපුම් දීමනාව | - | - |
| 12172 | වෙනත් දීමනා අනධ්‍යන කාර්‍ය මණ්ඩලය | 1,200.00 | - |
| 12201 | අතිකාල | 1,091,479.90 | - |
| 12202 | විශ්‍රාමික ප්‍රතිලාභ - අනධ්‍යන කාර්‍ය මණ්ඩලය | - | - |
| 12203 | විශේෂ මාසික දීමනාව - රු. 5000/- | 1,577,258.06 | - |
| 12204 | විශ්‍රාමික ප්‍රතිලාභ - අනධ්‍යන කාර්‍ය මණ්ඩලය - පූර්ව සේවා | 416,758.00 | - |
| 12205 | විශ්‍රාමික ප්‍රතිලාභ - අනධ්‍යන කාර්‍ය මණ්ඩලය - වත්මන් සේවා | 469,270.00 | - |
| 12206 | විශ්‍රාමික ප්‍රතිලාභ - අනධ්‍යන කාර්‍ය මණ්ඩල - පොළිය | 763,192.00 | - |
| 12207 | විශ්‍රාම මත සත්‍ය අදායම/පාඩුව | - | - |
| 2011 | ගමන් වියදම් (රට අභ්‍යන්තර) | 442,119.63 | - |
| 2022 | ගමන් වියදම් (විදේශ) | - | - |
| 3011 | ලිපිද්‍රව්‍ය සහ කාර්‍යාලීය අවශ්‍යතා | 972,392.97 | - |
| 3021 | ඉන්ධන සහ ලිහිසි තෙල් | 921,358.00 | - |
| 3031 | නිල ඇඳුම් | 161,770.50 | - |
| 3041 | යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ | - | - |
| 3051 | රසායනික සහ වීදුරු භාණ්ඩ | - | - |
| 3061 | වෛද්‍ය සැපයුම් | - | - |
| 3071 | අනෙකුත් සැපයුම් | 308,552.00 | - |
| 4011 | නඩත්තු - වාහන | 583,595.29 | - |
| 4021 | නඩත්තු - යන්ත්‍ර උපකරණ | 965,488.90 | - |
| 4031 | නඩත්තු- ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 16,560.00 | - |

| | | | |
|---|---|---|---|
| 4041 | නඩත්තු - ගෘහ භාණ්ඩ | 295,440.00 | - |
| 4051 | නඩත්තු - වෙනත් | 167,248.18 | - |
| 5011 | ප්‍රවාහන | 982,937.08 | - |
| 5021 | සන්නිවේදන | 604,578.72 | - |
| 5022 | තැපැල් ගාස්තු | 164,467.75 | - |
| 5031 | විදුලිය | 1,413,212.18 | - |
| 5032 | ජලය | 148,421.40 | - |
| 5041 | වරිපනම් සහ දේශීය බදු | - | - |
| 5051 | බදු කුලී සහ කුලී ගාස්තු | 11,701,749.84 | - |
| 5061 | ආරක්ෂක සේවා | 2,124,971.93 | - |
| 5071 | පිරිසිදු කිරීමේ සේවා | 1,067,373.00 | - |
| 5091 | මුද්‍රණ සහ ප්‍රචාරණ වැනි | 1,603,321.96 | - |
| 5101 | වෙනත් ගිවිසුම් ගත බැඳීම් | - | - |
| 6011 | විශ්වවිද්‍යාල ගුරුවරුන් සඳහා ගමන් වියදම් ප්‍රදාන | - | - |
| 6021 | විශේෂ සේවා- සංගම් සහ කමිටු | 745,100.00 | - |
| 6022 | විශේෂ සේවා- වෘත්තීමය සහ වෙනත් | 700,022.50 | - |
| 6031 | වැඩ මුළු, සම්මන්ත්‍රණ | 96,000.00 | - |
| 6041 | අධ්‍යන පර්යේෂණ සහ ප්‍රකාශන | - | - |
| 6051 | කායී මණ්ඩල සංවර්ධන (ගුරුවරුන්, පරිපාලන නිලධාරීන් සහ වෙනත් සේවා නියුක්තිකයින් සඳහා පුහුණු වැඩසටහන්) | 27,000.00 | - |
| 6061 | පශ්චාත් උපාධි පර්යේෂණ සහ ශිෂ්‍යත්ව | - | - |
| 6071 | සිසුන් සඳහා පාඨමාලා ද්‍රව්‍ය සහ ඉගෙනුම් කායේහි ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම | 245,816.59 | - |
| 6081 | කර්මාන්ත සීමාවසික පුහුණුව, ප්‍රායෝගික | - | - |
| 6091 | ශිෂ්‍ය සංවර්ධන ප්‍රවේශයන් | - | - |

| | | | |
|---|---|---|---|
| 6101 | විශ්වවිද්‍යාල ක්‍රීඩා ක්‍රියාකාරකම් | - | - |
| 6111 | ශිෂ්‍ය සුඛ සාධනය කායී මණ්ඩල සුඛ සාධනය | - | - |
| 6121 | සේවක සුඛසාධනය සහ වෛද්‍ය උපදෙස් | - | - |
| 6131 | සාමූහික සැලැස්ම සහ පාලනය | - | - |
| 6141 | වෙනත් සංවිධාන වෙත ප්‍රදානයන් | - | - |
| 6151 | දේපල ණය මත පොලී සහනය | 158,396.68 | - |
| 6161 | නිවාඩු බලපත්‍ර සහ වාර ප්‍රවේශ පත්‍ර | 243,070.00 | - |
| 6171 | උපාධි ප්‍රදානෝත්සව | - | - |
| 6181 | විනෝදාස්වාද කටයුතු වියදම් | 699,439.68 | - |
| 6191 | බැංකු ගාස්තු | 888.26 | - |
| 6201 | සම්මාන සහ හානිපූර්ණයන් | - | - |
| 6211 | දායක සහ සාමජික ගාස්තු | 1,500.00 | - |
| 6221 | විභාග වියදම් | 2,883,850.00 | - |
| 6231 | අනෙකුත් වියදම් | 95,793.85 | - |
| 6232 | පුස්තකාල සමීක්ෂණය සඳහා වියදම් | - | - |
| 6233 | සුඛ සාධක අරමුදල - චීනය - ගෙවීම් | - | - |
| 6234 | ක්ෂය වීම් - පුස්තකාල පොත් | - | - |
| 6235 | ක්ෂය වීම් - ගෘහ භාණ්ඩ සහ උපාංග | - | - |
| 6236 | ක්ෂය වීම් - මෝටර් රථ | - | - |
| 6237 | ක්ෂය වීම් - කායීාලීය උපකරණ | - | - |
| 6238 | ක්ෂය වීම් - විද්‍යාගාර සහ ඉගෙනුම් උපකරණ | - | - |
| 6239 | ක්ෂය වීම් - අස්පර්ශනීය වත්කම් | - | - |
| 6240 | අග්‍රහාර රන් රක්ෂණ වියදම් | - | - |

| | | | |
|---|---|---|---|
| 6241 | අන්වේශනා/සිංහල - 2020 | - | - |
| 6242 | අන්වේශනා/සිංහල - 2020 | - | - |
| 6243 | අන්වේශනා/ඉංග්‍රීසි - 2018 | - | - |
| 6244 | අන්වේශනා/ඉංග්‍රීසි - 2019 | - | - |
| 6245 | අධ්‍යන පර්යේෂණ වියදම්/පුනරාවර්තන | 1,334,396.61 | - |
| 6246 | මානව ප්‍රාග්ධන සංවර්ධනය/පුනරාවර්තන | - | - |
| 6247 | හුවමාරු අදායම්/පාඩු | 803,579.70 | - |
| 6248 | ස්වයං මූල්‍ය පාඨමාලා - වියදම් | 51,400,424.49 | - |
| | මුළු එකතුව | **1,161,699,687.53** | **1,161,699,687.53** |

බැංකු සැසඳුම් ප්‍රකාශය - ජංගම ගිණුම බොරැල්ල මහජන බැංකුව
30.12.2022 දිනට ගිණුම් අංක 078-1-01-7-2268401

| | රු | රු |
|---|---|---|
| 2022/12/01දිනට මුදල් පොත් ශේෂය | | 21,583,219.68 |
| <u>එකතුකිරීම්</u>**:** | | 37,945,979.12 |
| ජනවාරි මස නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් (ඇමුණුම 01) | 4,628,884.80 | |
| මුදල් පොතට හර නොකරන ලද අවලංගු කල චෙක් පත් | | |
| අමතර තැන්පතු | 500.00 | 4,629,384.80 |
| | - | **26,212,604.48** |
| **<u>අඩුකිරීම්</u>:** | | |
| බැංකුවට බැර නොකරන ලද අදායම් (තැන්පත් නොකළ/ නිශ්කාශනය නොවූ) | | |
| **බැංකු ගාස්තු, කොමිස් සහ වෙනත් ගාස්තු** | | |
| වෙනත් | | 0.00 |
| | | |
| 2022.12.30 දිනට බැංකු ශේෂය | | **<u>26,212,604.48</u>** |
| | | |
| 2022.12.01 දිනට මුදල් පොත් ශේෂය | | 11,597,326.55 |
| | | |
| <u>එකතු කිරීම්: මුළු ලැබීම්</u> | | 44,217,264.79 |
| <u>අඩු කිරීම් : මුළු ගෙවීම්</u> | | 22,634,045.11 |
| 2022.12.30 දිනට මුදල් පොත් ශේෂය | | **21,583,219.68** |

සකස් කලේ: .....

පරීක්ෂා කලේ: ..... දිනය: 2023/ 01/ 13

*ඉංග්‍රීසි පිටපතෙහි අත්සන යොදා ඇත.

**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**
2022 දෙසැම්බර් මාසය සඳහා ඉදිරිපත් නොකළ චෙක් පත් පිළිබඳ විස්තරය

බැංකු කේතය: 1300901 - මුදල් ගිණුම - බොරැල්ල ඇමුණුම: 01

| | | | රු. | රු. |
|---|---|---|---|---|
| අගෝස්තු 2022 | 2022-08-18 | 022307 -713 | 358,615.00 | 358,615.00 |
| | | | | |
| සැප්තැම්බර් 2022 | 2022-09-28 | 022378 -713 | 2,400.00 | 2,400.00 |
| නොවැම්බර් 2022 | 2022-11-24 | 022519 - 713 | 25,000.00 | 25,000.00 |
| | | | | |
| | | | | |
| 2022 දෙසැම්බර් | 2022-12-05 | 022530 -713 | 570,000.00 | |
| | 2022-12-08 | 022537 -713 | 44,975.00 | |
| | 2022-12-08 | 022538 -713 | 173,975.00 | |
| | 2022-12-08 | 022539 -713 | 1,500.00 | |
| | 2022-12-09 | 022540 -713 | 84,775.00 | |
| | 2022-12-14 | 022561 -713 | 2,134,995.13 | |
| | 2022-12-14 | 022562 -713 | 14,127.71 | |
| | 2022-12-14 | 022568 -713 | 10,000.00 | |
| | 2022-12-22 | 022577 -713 | 142,946.56 | |
| | 2022-12-22 | 022578 -713 | 100.00 | |
| | 2022-12-22 | 022579 -713 | 14,265.00 | |
| | 2022-12-28 | 022581 -713 | 6,503.49 | |
| | 2022-12-30 | 022586 -713 | 384,875.00 | |
| | 2022-12-30 | 022587 -713 | 57,920.00 | |
| | 2022-12-30 | 022588 -713 | 29,975.00 | |
| | 2022-12-30 | 022589 -713 | 99,975.00 | |
| | 2022-12-30 | 022590 -713 | 22,900.00 | |
| | 2022-12-30 | 022591 -713 | 10,000.00 | |
| | 2022-12-30 | 022592 -713 | 25,000.00 | |
| | 2022-12-30 | 022593 -713 | 406,911.91 | |
| | 2022-12-30 | 022594 -713 | 7,150.00 | 4,242,869.80 |
| | | | | 4,242,869.80 |

බැංකු සැසඳුම් ප්‍රකාශය - ජංගම ගිණුම නිබ්රිගස්යාය මහජන බැංකුව

ජංගම ගිණුම් අංකය: 086-1001-8-1189664
2022.12.31 දිනට

| | රු | රු |
|---|---|---|
| 2022/12/31දිනට මුදල් පොත් ශේෂය | | 31,613,354.69 |
| **එකතු කිරීම්**: | | |
| නිකුත් කරන ලද නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් | | - |
| මුදල් පොතට හර නොකරන ලද අවලංගු කල චෙක් පත් | | - |
| බැංකු ප්‍රකාශයෙන් හඳුනානොගන්න ලද අදායම් | | - |
| | | **31,613,354.69** |
| අඩුකිරීම්: | | |
| බැංකුවට බැර නොකරන ලද අදායම් (තැන්පත් නොකරන ලද/නිශ්කාශනය නොවූ) ඇමුණුම:01 | | 2,000.00 |
| **වෙනත්** | | |
| 2022/12/31 දිනට බැංකු ශේෂය | | **31,611,354.69** |
| **2022.12.31 මුදල් පොත් ශේෂය** | | **23,863,626.24** |
| එකතු කිරීම්: මුළු ලැබීම් | | 7,749,728.45 |
| අඩු කිරීම්: මුළු ගෙවීම් | | **31,613,354.69** |
| 2022.12.31 දිනට මුදල් පොත් ශේෂය | | **31,613,354.69** |

සකස් කලේ: .....

පරීක්ෂා කලේ: ..... දිනය: 2023/01/20

*ඉංග්‍රීසි පිටපතෙහි අත්සන යොදා ඇත.

**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**

2022 දෙසැම්බර් මාසය සඳහා නිෂ්කාශනයනොවූ චෙක් පත් පිළිබඳ විස්තරය

බැංකු කේතය: 1300902 - මුදල් ගිණුම - නිඹිරිගස්‍යාය ඇමුණුම: 01


| | | | රු. | රු. |
|---|---|---|---|---|
| 2022 දෙසැම්බර් | 2022-12-30 | T02146 VEN.S | 500.00 | |
| | 2022-12-30 | T02147 K.A.D | 500.00 | |
| | 2022-12-30 | T02148 VEN.G | 500.00 | |
| | 2022-12-30 | T02152 VEN.N | 500.00 | 2,000.00 |
| | | | | 2,000.00 |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. WPCG/GP/D/PIPB/1/22/06

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 ඔක්තෝම්බර් 16 දින







අධ්‍යක්ෂ,

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ **2022** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154(6)** ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා 2023 ඔක්තෝම්බර් 12 දින ඉදිරිපත් කරන ලද යථෝක්ත වාර්තාව භාෂාත්‍රයෙන් මේ සමඟ එවමි.

ඩබ්ලිව්.එම්.පී.ඒ.පොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය - 2022

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබෙද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිර්ණායකවලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුහාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුහාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු7,523,753ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණන කමිටු නිර්දේශය සහ කළමනාකාර මණ්ඩල අනුමැතිය ද සහිතව 2023 වර්ෂයේදී නැවත ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීමේ කටයුතු සිදුකර මෙය නිවැරදි කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වියදම් වර්ග 7 ක් සඳහා උපචිත වන වටිනාකම් නිවැරදිව හඳුනාගත හැකිව තිබුණද එසේ නොකිරීම හේතුවෙන් රු869,802.ක් අඩුවෙන් සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් හඳුනාගෙන තිබුණි. | අවසන් ගිණුම් පිළියෙල කරන අවස්ථාව වන විට ගිණුම් අංශය වෙත වාර්තා වී තිබූ වියදම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කර තිබුණු බවත් 2023 වර්ෂයේදී 2022 වර්ෂයට අදාළ වියදම් හඳුනාගතහොත් ඒවා පෙර වර්ෂය සඳහා ගැලපීම් යටතේ ගිණුම් ගත කිරීමට අපේක්ෂිත බවත්. | සමාලෝචිත වර්ෂයට අදාල උපචිත වියදම් හැකිතරම් නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කල යුතුය. |

1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ස්ථාවර වත්කම් | 37,395,757 | 33,574,087 | 3,821,669 | වර්ෂ 2015 දී සිදු කරන ලද ස්ථාවර වත්කම් සමාලෝචනයේ දී හඳුනාගත් වෙනස ගිණුම් ගත කිරීමේ දී ඇති වූ ගැටළු හේතුවෙන් විගණන කමිටු නිර්දේශය සහ කළමනාකාර මණ්ඩල අනුමැතිය ද සහිතව 2023 වර්ෂයේදී නැවත ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීමේ කටයුතු ක්‍රියාත්මක කර ඇති බව. | අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කල යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.221,756,371 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.121,227,900 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.100,528,471ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ත්‍යාග හා ප්‍රදාන ලැබීම්, ස්වයං මූල්‍ය පාඨමාලා ආදායම් හා ආයෝජන ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 මැයි 19 දින ඉදිකිරීම් නිම කිරීමට නියමිතව තිබූ සිවිමහල් ගොඩනැගිල්ල නියමිත දිනට වැඩ අවසන් නොකිරීම් හේතුවෙන් 2021 ජූනි සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුලදීද කුලී ගොඩනැගිල්ලක ආයතනය පවත්වා ගෙන යාමට සිදුවීමෙන් රු.17,577,755 ක අතිරේක වියදමක් ගොඩනැගිලි කුලී ලෙස ගෙවීමට සිදුවී තිබුණි. | කොන්ත්‍රාත්කරු වෙත අදාළ බිල්පත් පියවීමට ප්‍රමාද වීමෙන් මෙම තත්ත්වය උද්ගත වූ බව. | නියමිත කාලපරිච්ඡේදය තුළ ඉදිරිකිරීම් නිම කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ප්‍රකාශන හා වාර සහරා අලෙවිය සම්බන්ධයෙන් නිසි ඇගයීමක් සිදු නොකර මුද්‍රණය කිරීම හේතුවෙන් 1999 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල පිරිවැය රු.773,845ක් වූ ප්‍රකාශන හා වාර සහරා 2299 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අලෙවිකර ගත නොහැකිව ඉතිරි වී තිබුණි. | 2022 වර්ෂයේ විවිධ අවස්ථා වලදී අලෙවි කිරීම් හා පරිත්‍යාග වශයෙන් ප්‍රකාශන පොත් 366 ක් පමණ තොගයෙන් ඉවත් කර ඇති බව. ඉදිරියේදීද පොත් තොගය අවම කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | අලෙවිය හා බෙදා හැරීම සම්බන්ධ නිසි ඇගයීමක් සිදුකර ප්‍රකාශන හා වාර සහරා මුද්‍රණය කල යුතුයි. |

3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය තුළදී ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු ලීබඩු හා සවිකිරීම් ,කාර්යාල උපකරණ හා පුස්තකාල පොත් මිලදී ගැනීමට රු.2,265,804 ක් වැය කර තිබුණි. | 2022 වර්ෂයේ අවසාන වකවානුවේ කොහුවල පිහිටි ආයතනය මානෙල්ගම පරිශ්‍රය වෙත ස්ථාන මාරු වීම සිදු වූ බැවින් එම අවස්ථාවේදී හදුනාගත් නව අවශ්‍යතා වෙනුවෙන් ආයතනික විවිධ අරමුදල් භාවිතයෙන් මිලදී ගැනීම් සිදුකර ඇති බව. | ප්‍රසම්පාදන සැලැස්ම තුළ අවශ්‍ය මිලදී ගැනීම් සිදු කල යුතුය. |

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 16 න් ක්‍රියාකාරකම් 5ක් ආරම්භ කර නොතිබූ අතර ඉදිකිරීම් වලට අදල ක්‍රියාකරකම් 7ක සම්පූර්ණ කිරීමේ ප්‍රගතිය සියයට 50කට වඩා අඩු මට්ටමක පැවතුණි. | ඇතැම් ක්‍රියාකාරකම් වර්ෂයේ පැවති ප්‍රායෝගික තත්ත්වයන් හමුවේ ක්‍රියාත්මක නොකරන ලද අතර ඇතැම් සැලසුම් නව පරිශ්‍රයට පිවිසුන පසු ක්‍රියාත්මක කිරීමට තීරණය වූ බව. | ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් ඉටු කර ගැනීමට පියවර ගත යුතුය. |

4.2 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැයගත ආදායම් වියදම් තොරතුරු තත්‍ය ආදායම් වියදම් තොරතුරු සමඟ පරීක්ෂා කිරීමේදී අවස්ථා 14 කදී සියයට 4 සිට සියයට 707 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය සාර්ථක කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි. | විදේශ මුදල් හුවමාරු අනුපාතය ඉහළයාමත්, බැංකු පොළී අනුපාතය ඉහළ යාමත් නිසා බලාපොරොත්තුවූ ආදායමට වඩා වැඩි ආදායමක් උපයා ගැනීමට හැකිවූ අතර ස්වයං මූල්‍ය පාඨමාලා ආදායමින් ආයතනයේ වියදම් ආවරණය කිරීමත්, වියදම් පාලනයත් නිසා වියදම් ඉතිරිකර ගැනීමත් සිදුවී ඇති බව. | අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගත යුතුය. |

**<u>තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව</u>**

මෙම ආයතනය කැලණිය, නුවර පාර, බුළුගහ හන්දිය,University Drive හි අංක 977/5 හි 2022.12.01 දින ස්ථාපනය කරන ලදි.

එහි සැලසුම් හා ඉදි කිරීම් පරිසර හිතකාමී පදනමින් සංවිධානය වී ඇති අතර තවදුරටත් ඒවා සංවර්ධනය කරමින් පවතී. ඉන්දියන් ණය ආධාර ක්‍රමය යටතේ ක්‍රියාත්මක සූර්යබල ශක්ති ප්‍රභව භාවිතයට ගැනීම සම්බන්ධයෙන් වූ ව්‍යාපෘතියට අදාළව 2022 වර්ෂය අවසානයේදී මූලික කටයුතු ආරම්භ කර ඇත.

පෙර වර්ෂවලදී මෙන්ම ඉගැන්වීමේ ද්‍රව්‍ය විද්‍යාර්ථීන් වෙත මාර්ගගත සන්නිවේදන තාක්ෂණය ඔස්සේ සම්ප්‍රේෂණය කිරීමට විධි විධාන යොදා ඇත. තොරතුරු සම්ප්‍රේෂණය, ප්‍රතිඵල නිකුත් කිරීම, කාල සටහන් සහ දැන්වීම් සඳහා ආයතනික වෙබ් අඩවිය බහුලව භාවිත කෙරෙමින් කඩදාසි සහ ටෝනර් වියදම අවම කර ඇත.

මාර්ගගත සන්නිවේදන තාක්ෂණය ඔස්සේ සජීවී පන්ති කාමරයක අත්දැකීම දේශීය මෙන්ම විදෙස් සිසුන්ටද ලබා දීම සඳහා පන්ති කාමර 02 ක් තාක්ෂණිකව බලගැන්වීමට කටයුතු යොදා ඇත. එමගින් භෞතිකව ශිෂ්‍ය සහභාගීත්වය අවම කර විදුලිය, ජලය පරිභෝජනය සීමා කිරීමට අපේක්ෂිතය.

කසල හා බැහැරලන අපද්‍රව්‍ය දිරන නොදිරන වශයෙන් වෙන් කර බැහැර කරනු ලැබේ.

එමෙන්ම පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර වැනි නොදිරන සංයෝග අන්තර්ගතව නිපදවා ඇති උපකරණ හා ද්‍රව්‍ය ප්‍රසම්පාදනයේදී ඒවා අපහරණය කරන විට ද භාර ගැනීමට උනන්දුවක් දක්වන ආයතන වෙතින් ඉදිරි කාලය තුළ ප්‍රසම්පාදන කටයුතු කිරීමට අදාළ පාර්ශ්ව දැනුම්වත් කර ඇත.

නව ගොඩනැගිල්ලට ප්‍රවේශවීම මගින් තිරසර සංවර්ධන අරමුණු ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය වඩා වැඩි දායකත්වයක් ලබා දී ඇත.

එල්.ඒ. සුමිත් ජයසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී